No.5A, Police Park Place, Colombo 00500, Sri Lanka
Tel & Fax: + 94 11 2055544
Email: reception@veriteresearch.org

# ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය:

# වෛරී කථණය සහ වැරදි තොරතුරු සන්දර්භය තුළ නීතිමය හා නීතිමය නොවන රාමු පිළිබඳ විශ්ලේෂණයක්

## (සංක්ෂිප්ත වාර්තාව)

2020 දෙසැම්බර් මස සම්පාදනය කර (2021 මාර්තු මස සංශෝධනය කරන ලදි)

# පටුන


කෙටි යෙදුම් ........ 3

විධායක සාරාංශය ........ 4

**වෛරී කථනය, සාවද්‍ය තොරතුරු සහ ජාත්‍යන්තර නීති රාමුව පිළිබඳ කෙටි හැඳින්වීමක් ........ 5**

**1.** ශ්‍රී ලංකාවේ විධිමත් නියාමන රාමුව ........ 6

**1.1. 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති (ICCPR) පනත ... 7**

**1.2. 1883 අංක 2 දරන දණ්ඩ නීති සංග්‍රහය ........ 12**

**1.3. 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත ........ 14**

**1.4. 1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥා පනත ........ 14**

**1.5. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ........ 14**

**1.6. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ........ 15**

**1.7. 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත ........ 16**

**1.8. වෙනත් නියාමන යාන්ත්‍රණ සහ  ආයතන ........ 16**

**2.** විකල්ප නියාමන රාමුව ........ 17

**2.1. සමාජ මාධ්‍ය සමාගම් විසින් ස්වේච්ඡාවෙන් සිදු කරන ස්වයං-නියාමනයන් ........ 17**

**2.2. මාධ්‍ය ක්ෂේත්‍රය තුලින් ම බිහි කරගන්නා ස්වාධීන යාන්ත්‍රණ. ස්වාධීන කර්මාන්ත මට්ටමේ නියාමනය ........ 20**

**2. .3සිවිල් සමාජය සහ පෞද්ගලික ආයතන විසින් ප්‍රති-පණිවුඩ යැවීම සහ සදාචාරාත්මක ප්‍රවේශය මත සිදුවන සම්බන්ධීකරණය ........ 20**

නිගමනය සහ නිර්දේශ ........ 21

නිර්දේශ ........ **Error! Bookmark not defined.**

පරිච්ඡේදාන්ත සටහන් ........ 26

## කෙටි යෙදුම්

| | |
|---|---|
| ඒ එෆ් පී | ප්‍රංශ නියෝජිත පුවත් සේවය |
| ඒ අයි | කෘත්‍රිම බුද්ධිය |
| බී බී එස් | බොදුබල සේනා |
| සී අයි ඩී | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| ද්රික්සෝ | ඩිමොක්රසි රිපොර්ටින් ඉන්ටනැෂනල් සිවිල් සමාජ සංවිධානය |
| ඊ ආර් | හදිසි නීති රෙගුලාසි |
| එච් ආර් සී එස් එල් | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව |
| අයි සී සී පී ආර් පනත | 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ ජාත්‍යන්තර සම්මුති පනත |
| අයි සී සී පී ආර් | සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ ජාත්‍යන්තර සම්මුතිය |
| අයි ජී පී | පොලිස්පති |
| එන් පී සී | ජාතික පොලිස් කොමිසම |
| අයි එච් ආර් එල් | ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය |
| පී එස් ඕ | 1947 අංක 25 දරන මහජන ආරක්ෂක පනත |
| පී ටී ඒ | 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත |
| එස් එල් සාර්ට් | ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය / සම්බන්ධීකරණ මධ්‍යස්ථානය |
| එස් එල් පී අයි | ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය |
| එස් එල් ටී ඒ | 1991 අංක 25 දරන ශ් රී ලංකා විදුලි සංදේශන පනත |
| එස් එල් ටී ආර් සී | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව |

## විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය නියාමනය විධිමත් නියාමන රාමුව හා විකල්ප නීතිමය නොවන නියාමන රාමුව යන නියාමන රාමු ද්විත්වයෙන් සංයුක්ත වේ. මෙම අධ්‍යයනය විශේෂයෙන් ම වෛරී කථනය සහ සාවද්‍ය තොරතුරු සම්බන්ධව ඉහත නියාමන රාමු අදාළ වන අන්දම සාකච්ඡා කරයි. එමගින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ නිශ්චිත සන්දර්භය තුළ සමාජ මාධ්‍යයන් හී වැරදි තොරතුරු සහ වෛරී ප්‍රකාශ පැතිරවීමේ විභව ඇඟවුම් ඉදිරිපත් කරයි. විධිමත් නියාමන රාමුව යටතේ, වෛරී කථනය සහ සමාජ මාධ්‍යවල ප්‍රචාරය කෙරෙන වැරදි තොරතුරු දේශීය නීති සහ රෙගුලාසි අධ්‍යයනය මගින් ගෙනහැර දක්වයි. කෙසේ වෙතත්, අධ්‍යයනයෙන් හෙළි වී ඇත්තේ නීතිය බලාත්මක කරන ආයතන පනතේ වපසරිය තුළට සීමාව ඉක්මවූ පරාසයක ප්‍රකාෂණ ඇතුලත් කර ගැනීම හේතුවෙන් භෞතික හා අථත්‍ය අවකාශයන්හි මෙම නීති සහ රෙගුලාසි බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම අපයෝජනය වීමේ අවදානමක් උද්ගතව ඇති බවයි. මෙසේ සීමාව ඉක්මවා ඇතුළත් කිරීම නෛතික රාමුව තුළ එන පාරිභාෂික වචනවල ඇති අපැහැදිලිතාවය හේතු කොට ගෙන වෛරී ප්‍රකාශයක් නොවන ප්‍රකාශන ආවරණය කිරීම සඳහා පවා රාජ්‍යය විසින් නීතිය පුළුල් ලෙස අර්ථ නිරූපනය කිරීමට හේතු විය හැකි ය.

ඉන් අනතුරුව මෙම අධ්‍යයනය, විධිමත් නියාමන රාමුවට අනුපූරක යාන්ත්‍රණයක් ලෙස විකල්ප නියාමන රාමුව සාකච්ඡාවට ගනු ලබයි. විකල්ප නීතිමය නොවන නියාමන රාමුව සමාජ මාධ්‍ය නියාමනය සඳහා වන යාන්ත්‍රණ තුනක් අනුව සාකච්ඡා කෙරේ: (i) සමාජ මාධ්‍ය සේවා සපයන්නන් විසින් ස්වේච්ඡාවෙන් ස්වයං-නියාමනය කිරීම, (ii) ස්වාධීන ජාත්‍යන්තර නියාමනය සහ (III) සිවිල් සමාජය සහ පෞද්ගලික ආයතනයන් මගින් ප්‍රති-පණිවිඩ යැවීම සහ සදාචාරාත්මකව කටයුතු කිරීම. සිංහල හා දෙමළ භාෂාවල අන්තර්ගතය විසින් ඇති කරන සුවිශේෂී අභියෝගයන් සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය ඵලදායී ලෙස නියාමනය කිරීම සඳහා එවැනි යාන්ත්‍රණවල එකතුවක් අවශ්‍ය වේ.

මෙම අධ්‍යයනය, විධිමත් හා විකල්ප රාමු හරහා ශ්‍රී ලංකාවේ වෛරී කථනය සහ වැරදි තොරතුරු ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීමට නිර්දේශ ඉදිරිපත් නොකරන අතර, පාර්ශවකරුවන් විසින් සලකා බැලිය හැකි ප්‍රධාන විකල්ප අටක් පිළිබඳ නිරීක්ෂණ ලබා දෙයි. එවැනි පාර්ශවකරුවන්ට රජය, තාක්‍ෂණික සේවා සපයන සමාගම් සහ සිවිල් සමාජය ඇතුළත් වන අතර, සමාජ මාධ්‍ය තුළ අසත්‍ය තොරතුරු පැතිරවීම සහ වෛරී ප්‍රකාශ සිදුකිරීම අවම කිරීම සඳහා මෙම විකල්පයන් භාවිත කිරීම ගැන ගවේෂණය කළ හැකිය.

මෙම අධ්‍යයනය ඩිමොක්‍රසි රිපෝර්ටින්ග් ඉන්ටනැෂනල් (ඩී ආර් අයි) ආයතනය වෙරිටේ රිසර්ච් ආයතනය (වෙරිටේ)වෙත වෛරී ප්‍රකාශ සහ සාවද්‍ය තොරතුරු සම්බන්ධව ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය සඳහා දැනට පවතින නීති හා නීති නොවන නියාමන රාමු පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ විශ්ලේෂණ සැපයීම පිණිස සිදු කරන ලද පැවරුමකි. මෙම අධ්‍යයනය හුදෙක් ලිඛිත මූලාශ්‍ර මත පදනම් වූ පර්යේෂණාත්මක විශ්ලේෂණයක් ලෙස සිදු කරන ලද අතර එය ප්‍රසිද්ධියේ ලබා ගත හැකි ද්විතීයික තොරතුරු මූලාශ්‍ර සමාලෝචනයකින් සම්පාදනය කරන ලදි. මෙහි නිගමනයන් පර්යේෂණාත්මක විශ්ලේෂණයන් මත පදනම්ව ඉදිරිපත් කර ඇති අතර වෙරිටේ විසින් සාකච්ඡා කළ නිරීක්ෂණයන් ශ්‍රී ලංකාවේ මාර්ගගත අන්තර්ගතයන් ප්‍රමිතිකරණය පිනිස යොදා ගැනීම ගැන අවධානය යොමු විය. මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ලිඛිත මූලාශ්‍ර මත පදනම් වුවද, පර්යේෂණ කණ්ඩායම 2020 අවසානයේ පැවැත්වූ බහුවිධ සැසිවාර වලින් පසුව එකලස් කරගත් ප්‍රතිපෝෂණාත්මක කරුණු ද ඇතුළත් කරන ලදී. 2020 සැප්තැම්බර් සිට 2020 දෙසැම්බර් දක්වා කාලය තුළ සිවිල් සමාජය, ප්‍රධාන ධාරාවේ ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය, නීති වෘත්තිකයින් සහ වෙනත් කණ්ඩායම් වල නියෝජිතයින්ගෙන් සමන්විත සැසි පහක් පැවැත්විණි.[1]

වාර්තාවේ අන්තර්ගතය 2020 ජූලි වන විට යාවත්කාලීන කළ අතර එහි නිරීක්‍ෂණ යාවත්කාලීන සැසි මත පදනම්ව 2020 දෙසැම්බර් වන විට යාවත්කාලීන කරන ලදි. අවසාන වාර්තාව 2021 පෙබරවාරි මාසයේදී ඉදිරිපත් කරන ලද අතර ලැබුණු ප්‍රතිචාර මත පදනම්ව වාර්තාව 2021 මාර්තු මාසයේදී සංශෝධනය කෙරිණි. මෙය සාරාංශ වාර්තාවක් වන අතර වැඩි විස්තර සහ විශ්ලේෂණය සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් එළ කරන සම්පූර්ණ වාර්තාව බලන්න.

## හැඳින්වීම

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික හා ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා වැඩි වෙමින් පවතී. මෙම බොහොමයක් සිදුවීම් සඳහා සමාජ මාධ්‍ය තුල පැතිර ගිය වෛරී කතනයන් සහ වැරදි තොරතුරුවල දායකත්වයක් පැවති අතර, එය අදාළ සිදුවීම්වලට පෙර මෙන් ම පසුව ද දක්නට ලැබිණි. සමාජ මාධ්‍යවල වෛරී කථණය සහ වැරදි තොරතුරු නියාමනය කිරීම සිවිල් සමාජය, රාජ්‍යයන්, නියාමන ආයතන, පෞද්ගලික ආයතන, මාධ්‍ය සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට ගෝලීය අභියෝගයක් වී තිබේ. විශේෂයෙන් අතත්‍ය ලෙස පැතිරෙන වැරදි තොරතුරු සහ වෛරී ප්‍රකාශ හේතුවෙන් අතත්‍ය නොවන සීමාව කරා හානිය පැතිර යා හැක. මෙම අභියෝගයට වැඩි වශයෙන් හිමිවන ප්‍රතිචාරය වන්නේ සමාජ මාධ්‍ය තුළ කතිකාව සඳහා දැඩි නියාමනයන් පැනවීමයි. සමාජ මාධ්‍ය පාලනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන එවැනි නියාමනයන් පැනවීමට පෙර හොඳින් සලකා බැලිය යුතුය. අදහස් හුවමාරු කර ගැනීමේ නිදහස සීමා නොවන බවට සහතික වීමට අවධානය යොමු කළ යුතු අතර එවිට හුදු ප්‍රතිවිරුද්ධ අදහස් ප්‍රකාශ කිරීම සීමා වන්නේ නැත.

මෙම අධ්‍යයනයෙන් සමාජ මාධ්‍ය තුළ වෛරී ප්‍රකාශ සහ වැරදි තොරතුරු වලට එරෙහි වීමෙහි ලා පවතින ප්‍රධාන අභියෝග හතරක් හඳුනා ගනී. පළමුව, වෛරී කථනය සහ සාවද්‍ය තොරතුරු ඇතුළත් සබැඳි අන්තර්ගතයන් ඉක්මනින් ප්‍රතිනිර්මාණය කිරීම සමාජ මාධ්‍ය වේදිකා තුළ අන්තර්ගතය ඵලදායී ලෙස නවීකරණය කිරීමට අභියෝගයක් බව පෙනී ගොස් තිබේ.[2] දෙවනුව, කථන හා ප්‍රකාශන නවීකරණය කිරීමට පවතින නීති පද්ධතිය තුළ සහජ අඩුපාඩු පවතී. උදාහරණයක් ලෙස, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය (IHRL) කථනය සහ ප්‍රකාශනය නීත්‍යානුකූලව සීමා කිරීම සඳහා ප්‍රමිති කිහිපයක් දක්වා තිබුන ද, කිසියම් ප්‍රකාශයක් වෛරී කථනය සහ වැරදි තොරතුරු සනයට ගැනෙන්නේ ද යන්න ගැන පොදු එකඟතාවයක් නොමැත.

ශ්‍රී ලාංකික සන්දර්භය තුළ සුවිශේෂී ලෙස හඳුනා ගත හැකි තුන්වන අභියෝගය වන්නේ භාෂාව හඳුනා ගැනීමයි. නිදසුනක් වශයෙන්, සංස්කෘතික/සන්දර්භීය යොමු කිරීම් පරිවර්තන ක්‍රියාවලියේ දී ඉවත්ව යාම හේතුවෙන් ඇතැම් සිංහල හා දෙමළ අන්තර්ගතයන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කළ විට එය සමාජ මාධ්‍ය ප්‍රජා මාර්ගෝපදේශ වල අර්ථ දක්වා ඇති පරිදි වෛරී කථණයක් නොවිය හැකිය. අවසාන අභියෝගය වන්නේ සබැඳි වෛරී කථාව සහ වැරදි තොරතුරු සම්බන්ධව විවිධ පාර්ශවයන් වගකීමට ලක් කල හැකි නීතිමය ආකෘති නිර්මාණය කළ යුත්තේ කෙසේද යන්නයි. මෙම පාර්ශවකරුවන් අතරට අන්තර්ජාල අතරමැදියන්, තනි පුද්ගල පාර්ශවකරුවන්, රජය සහ පෞද්ගලික අංශය ඇතුළත් වේ. නිදසුනක් වශයෙන්, වෛරී ප්‍රකාශ සහ වැරදි තොරතුරු වලට එරෙහිව සටන් කිරීම සම්බන්ධ නීතිමය රාමුව ශක්තිමත් කිරීම, කතා කිරීමේ නිදහස කෙරෙහි බරපතල බලපෑම් ඇති කළ හැකිය. එබඳු එක් ඇඟවුමක් නම් හුදු විසම්මුතික ප්‍රකාෂකයන්ට පීඩා කිරීම සඳහා නීති අනිසි ලෙස භාවිතා කිරීම යි.

### වෛරී කථනය, සාවද්‍ය තොරතුරු සහ ජාත්‍යන්තර නීති රාමුව පිළිබඳ කෙටි හැඳින්වීමක්

වෛරී කථණය පිළිබඳ විශ්වීයව පිළිගත් අර්ථ දැක්වීමක් නොපවතී.[3] 'වෛරී කථණය හුදෙක් 'වෛරය වෙනුවෙන් පෙනී සිටීම' යනුවෙන්' පොදුවේ අවබෝධ කර ගත හැකි ය. හානිකර හෝ අහිතකර වන සෑම කථාවක්ම අපරාධ සම්බාධක මගින් සීමා කළ යුතු බව මින් අදහස් වන්නේ නැත. කෙසේ වෙතත්, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (අයිසීසීපීආර්) 20 (2) වගන්තිය සුවිශේෂී ආකාරයේ හානිකර ප්‍රකාශයන් හඳුනා ගනී. ඒ අනුව, ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී සිටින ප්‍රකාශයන්මෙන් ම, එතුලින් යම් වෙනස් කොට සැලකීමකට, සතුරුකමකට හෝ ප්‍රචණ්ඩත්වය ඇති කිරීමට හේතු වන්නේ නම්, ඒවා නීතියෙන් තහනම් කළ යුතු ය. අයිසීසීපීආර් හි 20 (2) වගන්තියේ ඇති නිශ්චිත යෙදුම් බොහෝමයක් ජාත්‍යන්තර නීතියේ අර්ථ දක්වා නැත. කෙසේ වෙතත්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ සමානාත්මතාවය පිළිබඳ කැම්ඩන් මූලධර්ම වැනි බැඳීම් රහිත

මෑඳු නීති මෙවලම් ICCPR හි 20 (2) වගන්තියේ අඩංගු නිශ්චිත කොන්දේසි අර්ථ නිරූපණය කිරීම සඳහා මග පෙන්වීමක් සපයයි:[4]

- ඉලක්කගත කණ්ඩායම කෙරෙහි 'වෛරය', 'සතුරුකම' ' – 'බලවත් අපකීර්තිය, එදිරිවාදිකම සහ ද්වේෂය පිළිබඳ දැඩි හා අතාර්කික හැඟීම් පැතිරවීම.
- 'උපදේශනය' - ඉලක්කගත කණ්ඩායම කෙරෙහි ප්‍රසිද්ධියේ වෛරය ප්‍රවර්ධනය කිරීමේ අභිප්‍රාය අවශ්‍යවේ.
- 'උසිගැන්වීම (පෙළඹවීම)' -ජාතික, වාර්ගික හෝ ආගමික කණ්ඩායම් කෙරෙහි නියත අවදානමක් ඇති කරමින් එම කණ්ඩායම්වලට අයත් පුද්ගලයින්ට එරෙහිව) වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වය මුදා හැරෙන අන්ධමේ ප්‍රකාශ සිදු කිරීම.

අයිසීසීපීආර් හි 19 වන වගන්තිය මගින් භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පැහැදිලිවම සහතික කර තිබේ.[5]

ශ්‍රී ලංකාව 1980 දී අයිසීසීපීආර් සම්මුතිය අපරානුමත කළ අතර එමගින් අයිසීසීපීආර් විසින් පිළිගත් අයිතිවාසිකම්වලට ගරු කිරීමට, ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට නීත්‍යානුකූලව බැඳී සිටී.[6] එවැනි සීමාවන් අවශ්‍ය වන අවස්ථාවන්හිදී අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස නීතියෙන් සීමා කිරීමට අයිසීසීපීආර් සම්මුතිය අවසර දෙයි. ඒ අනුව, (අ) අන් අයගේ අයිතිවාසිකම් හෝ කීර්තිනාමයට ගරු කිරීම හෝ (ආ) ජාතික ආරක්ෂාව, මහජන සාමය, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම යන අවස්තාවන් හීදී මෙකී ව්‍යතිරේඛයන් යොදා ගනු ලබයි.[7] මෙම ප්‍රමිති සහ මූලධර්ම අන්තර්ජාලය හරහා සිදු කරන ප්‍රකාශයන්ට ද සමානව අදාළ වන බව ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය ද පිළිගනු ලබන්නකි.[8]

තහනම් කළ යුතු වෛරී කථනයන් හඳුනා ගැනීම සඳහා කොටස් හයක පරීක්ෂණයක් රබාත් ක්‍රියාකාරී සැලැස්ම මගින් යෝජනා කරයි.[9] ප්‍රකාශනයක් තක්සේරු කිරීමේදී ප්‍රධාන සාධක හයක් ඇගයීම මෙම පර්යන්ත පරීක්ෂණයට ඇතුළත් වේ: (i) ප්‍රකාශනය කරන සමාජ හා දේශපාලන සන්දර්භය; (ii) කථිකයා, උදාහරණයක් ලෙස, ඔහුගේ හෝ ඇයගේ තත්වය සහ බලපෑම; (iii) ප්‍රකාශනයේ අභිප්‍රාය කවරේද; (iv) ප්‍රකාශනයේ අන්තර්ගතය හෝ ස්වරූපය; (v) ප්‍රකාශනයේ තීව්‍රතාවය හෝ කොතරම් පිරිසකට ළඟා වන්නේ ද; සහ (vi) ප්‍රකාශනයෙන් හානියක් සිදුවීමේ සම්භාවිතාව; මීට අයත් වේ.

වැරදි තොරතුරු පුළුල් ලෙස අර්ථ දැක්වෙන්නේ නොමඟ යවන හෝ හානියක් කිරීමේ අදහසින් දැනුවත්ව හෝ හිතාමතාම බෙදාගත් හෝ බෙදා හරින ලද ව්‍යාජ තොරතුරු වශයෙනි.[10] සාවද්‍ය තොරතුරු ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී සිටීමේ කොටසක් වන අතර එය වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වය සඳහා පෙළඹවීමක් වේ. මෙවැනි ප්‍රකාශන අයිසීසීපීආර් සම්මුතියේ 20 (2) වගන්තියට අයත් වන අතර ඒවා තහනම් කළ යුතු ය.

## 1. ශ්‍රී ලංකාවේ විධිමත් නියාමන රාමුව

මෙම කොටසින් ඕභාෂණය සහ ප්‍රකාශනය නියාමනය කිරීමට අදාළ නීති හඳුනා ගන්නා අතර, විෂයට අදාලව ලබා දී ඇති නඩු තීන්දු සාකච්චා කරමින් මෙම නීති මෑත කාලයේ දී ක්‍රියාත්මක වන අන්දම ගැන අවබෝධයක් ලබා දෙයි. ශ්‍රී ලංකාවේ 'විධිමත්' නියාමන රාමුව තුළ ඇති වෙනත් නියාමන යාන්ත්‍රණ පිළිබඳව ද මෙහි දී කෙටියෙන් සාකච්ඡා කෙරේ.

**භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සෑම පුරවැසියෙකුටම ප්‍රකාශනය ද ඇතුළුව භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහතික කර තිබේ.[11] ජාතික හෝ ආගමික සමගිය සුරැකීම, පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම, අධිකරණයට අපහාස කිරීම හෝ වෙනත් ආකාරයක අපහාසයන් මෙන් ම වරදකට උසිගැන්වීම වැළැක්වීම උදෙසා නීතියෙන් නියම කර ඇති පරිදි ඉහත අයිතිවාසිකම සීමා කළ

හැකි ය.[12] අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම හෝ අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස සඳහා නිසි පිළිගැනීමක් හා ගෞරවයක් ලබා ගැනීම හෝ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සුභසාධනය සඳහා පොදු අවශ්‍යතා සපුරාලීම උදෙසා සීමා කළ හැකිය.[13]

***වෛරී කථනය හා වැරදි තොරතුරු වලට එරෙහිව සටන් කිරීමට අදාළ ව්‍යවස්ථාපිත නීති***

ශ්‍රී ලංකාවේ වෛරී කථනය හා වැරදි තොරතුරු මැඩලීම සඳහා නීති කිහිපයක් අදාළ විය හැකිය. මේවාට:

1. 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති (ICCPR) පනත
2. 1883 අංක 2දරන දණ්ඩ නීති සංග්‍රහ පනත
3. 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත
4. 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥා පනත
5. 1991 අංක 25 දරනශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (එස්එල්ටීඒ),
6. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික) විධිවිධාන පනත (පීටීඒ)
7. 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත

## 1.1. 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති (ICCPR) පනත

2007 නොවැම්බර් 16 වන දින ශ්‍රී ලංකාව විසින් අයිසීසීපීආර් පනත බලාත්මක කරනු ලැබුවේ මීට පෙර දේශීය නීතියෙන් පිළිගැනීමක් ලබා නොදුන් මානව හිමිකම් සම්බන්ධ අයිසීසීපීආර් හි ඇතැම් වගන්ති මෙරට තුළ බලාත්මක කිරීම සඳහා ය.[14]

පනතේ 3 වන වගන්තියෙන් අයිසීසීපීආර් හි 20 වන වගන්තිය බලාත්මක කරන අතර යුද්ධය ප්‍රචාරය කිරීම හෝ වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වයට පොළඹවන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී සිටීම අපරාධමය වරදක් බවට පත් කර තිබේ. තවද, මෙම වරද සිදුකිරීමට උත්සාහ කරන, තර්ජනය කරන හෝ ආධාර අනුබල දෙන ඕනෑම පුද්ගලයෙකු වරදකරුවෙක් වන අතර උපරිම වසර දහයක බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකිය. මෙම වරද ‘සංඥය වරදක් (වරෙන්තු නොමැතිව අත්අඩන්ගුවට ගත හැකි වරදක්) මෙන් ම ඇප දිය නොහැකි වරදක් වන අතර, සුවිශේෂී අවස්තාවක පමණක් මහාධිකරණයට ඇප ලබා දිය හැකි ය.[15]

මෙම නීතිමය විධිවිධානය ප්‍රශ්නකාරී වන්නේ එය විවිධ ආකාරයේ පෙළඹවීම් කාණ්ඩ කර එක වරදක් තුලට ගොනු කරන බැවිනි. වඩාත් තියුණු පෙළඹවීම් පමණක් අපරාධ ලෙස නම් කල යුතු බව රබාත් ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබේ.[16] වරදක් පුළුල් හා අපැහැදිලි ලෙස අර්ථ දැක්වීම එය අයතා ලෙස යෙදවිය හැකි වටපිටාවක් සකසන අතර අපරාධමය සම්බාධක අවශ්‍ය නොවන ප්‍රකාශ අපරාධකරණය කරයි. නිදසුනක් වශයෙන්, උක්ත විධිවිධාන යටතේ, හුදෙක් මතභේදාත්මක හෝ විසංවාදී ප්‍රකාශනයක් සම්බාධක අවශ්‍ය ‘වෛරී ප්‍රකාශයක් ලෙස සැලකීමට රාජ්‍යයට හැකි ය.

2019 අගෝස්තු මස, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වැඩබලන පොලිස්පති වෙත ලිපියක් යවමින්, අයිසීසීපීආර් පනත බලාත්මක කිරීම තුලින් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා තීරණාත්මක පියවර ගැනීමට නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් පොදුවේ අකැමැත්තක් දක්වන බව පෙන්වා දෙන ලදී.[17] ප්‍රධාන වශයෙන් රබාත් ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඇතැම් මාර්ගෝපදේශ සම්මත කර ගැනීමට මානව හිමිකම් කොමිෂන් සභාව තවදුරටත් යෝජනා කළ අතර පනත බලාත්මක කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේදී කොටස් හයක පරීක්ෂණය අනුගමනය කරන ලෙස

නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ගෙන් ඉල්ලා සිටියේය. ICCPR පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධ නිරීක්ෂණ දෙකක් පවතී:

(i) අයිසීසීපීආර් පනත යටතේ වරදකරුවන් හෝ ප්‍රමාණවත් නඩු පැවරීම් නොමැති වීම; සහ
(ii) අයිසීසීපීආර් පනත අනවශ්‍ය පුළුල් බවකින් යොදවා ගැනීම.

*(i). අයිසීසීපීආර් පනත යටතේ වරදකරුවන් හෝ ප්‍රමාණවත් නඩු පැවරීම් නොමැති වීම;*

අයිසීසීපීආර් පනත බලාත්මක වූ දා පටන් ම සුළුතර කණ්ඩායම්වලට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹවීම සම්බන්ධයෙන් වගකිව යුතු කිසිවෙකුත් ඒ යටතේ වරදකරුවෙකු නොකෙරිණි.[18]

වගුව 1: අයිසීසීපීආර් පනත යටතේ වරදකරුවන් හෝ ප්‍රමාණවත් නඩු පැවරීම් නොමැති බවට සිද්ධිමය උදාහරණ.

| සිද්ධිමය උදාහරණය | සිදුවීම පිළිබඳ විස්තර | අයිසීසීපීආර් පනත යෙදෙන අයුරු |
|---|---|---|
| අළුත්ගම, ධර්ගා නගරය, වැලිපැන්න සහ බෙරුවල ප්‍රචණ්ඩ ක්‍රියා (2014) | ▪ බෞද්ධ භික්ෂුවක් සහ මුස්ලිම් තරුණයන් තිදෙනෙකු අතර ගැටුමක් ඇති වූ අතර එහි දී භික්ෂුවට හිරිහැරවූ බවට චෝදනා කෙරිණි. එය ප්‍රදේශයේ නොසන්සුන්කාරී වාතාවරණයක් ඇති වීමට හේතු විය.<br>▪ මුස්ලිම් විරෝධී හැඟීම් පවත්නා අතර බොදු බල සේනා සංවිධානය පවත්වන ලද රැලියකදී එහි මහලේකම් ගලබොඩ අත්තේ ඥානසාර හිමියන් විසින් මුස්ලිම්වරුන් ඉලක්ක කර ගනිමින් කුපිතකරවනසුළු කතාවක් පැවැත්වීය.[19]<br>▪ ඉක්බිතිව ඇරඹි මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා සහ කැරලි කෝලාහල දින දෙකකට වැඩි කාලයක් පුරා පැවතුනි. වාර්තා වූ පරිදි ආසන්න වශයෙන් පුද්ගලයින් තිදෙනෙකු මිය ගිය අතර නිවාස හා ව්‍යාපාර 152 ක් පමණ විනාශ විය.[20]<br>▪ එදිනම පොලීසිය විසින් ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, අළුත්ගම අවට ප්‍රදේශවල මැර ප්‍රහාර එල්ල වූ අතර, එය මුස්ලිම්වරුන්ට අයත් ව්‍යාපාර හා නිවාස මෙන්ම සිංහලයින්ට අයත් සමහර නිවාසවලට ද බලපෑවේය.[21] | ▪ ප්‍රචණ්ඩත්වය උසිගැන්වීම සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකු වරදකරුවෙකු වූ බව වාර්තා නොවී ය.[22] |
| ගින්තොට මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා (2017) | ▪ හදිසි අනතුරකින් පසු ප්‍රචණ්ඩත්වය උත්සන්න වූ අතර, පසුව මුස්ලිම් දේශපාලනඥයෙකු විසින් ගින්තොට සිංහල නිවාසවලට පහර | ▪ ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ සැකකරුවන් 22 දෙනෙකු අයිසීසීපීආර් පනත යටතේ මුලින් අත්අඩංගුවට ගත් බව |

| | | |
|---|---|---|
| | දීමට මැර පිරිසක් මෙහෙයවූ බවට කටකතාවක් පැතිර ගියේය.[23]<br><br>▪ ඉක්බිතිව, මුස්ලිම් නිවාස, දේපළ, ව්‍යාපාර කිහිපයක් පහර කෑමට ලක් වූ අතර පුද්ගලයින් හතර දෙනෙකු තුවාල ලැබූ බව වාර්තා විය.[24]<br><br>▪ මුලින් එම ප්‍රදේශයට ඇඳිරි නීතිය පැනවූ අතර පසුව අසල්වැසි ප්‍රදේශ වන කුරුඳුවත්ත, මහ හපුගල, වැලිපිටිමෝදර, උක්වත්ත සහ පියදිගම දක්වා ව්‍යාප්ත කෙරිණි.[25] | ප්‍රවෘත්ති මඟින් වාර්තා විය.[26]<br>▪ කෙසේ වුවද, පනත යටතේ කිසිවෙකුටත් සත්‍ය වශයෙන්ම නඩු පැවරීම පිළිබඳ තොරතුරු නොමැත. |
| අම්පාර ප්‍රදේශයේ සිදු වූ ප්‍රහාර (2018) | ▪ මුස්ලිම් අවන්හලක තම ආහාරවල 'වන්ධ්‍යාකරණ පෙති' මිශ්‍ර කර ඇති බව සිංහල පාරිභෝගිකයෙකු ප්‍රකාශ කිරීමෙන් පසුව අම්පාර ප්‍රදේශයේ අන්තර් වාර්ගික ආතතීන් ඇති විය.[27]<br><br>▪ සිද්ධිය පිළිබඳ වීඩියෝ දර්ශන ෆේස්බුක් හි පුළුල් ලෙස බෙදා ගැනුණි. මෙම වීඩියෝව අවන්හලේ හිමිකරු වරද පිළිගන්නා බවට දැක්වීම පිණිස ව්‍යාජ නිරූපණයක් සහිත අතර ගනුදෙනුකරු ප්‍රශ්න කරන අවස්ථාවේ දී හිමිකරු හිස සොලවා යමක් පිළිගන්නා බව එහි විය.<br><br>▪ සිංහල-බෞද්ධ ප්‍රජාව වන්ධ්‍යාකරණය කිරීම සඳහා මුස්ලිම් කුමන්ත්‍රණයක් සම්බන්ධ බිය තහවුරු කිරීම සඳහා මෙම වීඩියෝව භාවිතා කරන ලදී.[28]<br><br>▪ අවන්හල් හිමිකරු පසුව කියා සිටියේ තමාට සිංහල නොතේරෙන බවත් බියෙන් තැතිගෙන සිටි නිසා හිස සෙලවූ බවත්ය.[29] | ▪ වන්ධ්‍යාකරණ පෙති යැයි කියනු ලැබූ දේ කැටිගැසුනු පිටි බව රජයේ රසපරීක්ෂක අනාවරණය කළේය.[30]<br><br>▪ සිද්ධිය සම්බන්ධයෙන් අයිසීසීපීආර් පනත යටතේ කිසිවෙකු අත්අඩංගුවට ගෙන නොමැති බව වාර්තා වේ. |
| දිගන සහ තෙල්දෙණිය ප්‍රදේශවල සිදු වූ ප්‍රහාර (2018) | ▪ රථවාහන සම්බන්ධ සිදුවීමකින් පසු මුස්ලිම් ජාතිකයන් සිව් දෙනෙකු විසින් සිංහල ජාතිකයෙකුට පහරදීමට පලිගැනීමක් ලෙස ප්‍රචණ්ඩත්වය අවුලුවන ලද බව වාර්තා වේ. ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සතියකට පෙර මෙම පහරදීම සිදුවී තිබිණි .[31]<br>රජය විසින් සමහර සමාජ මාධ්‍ය වේදිකාවලට ප්‍රවේශ වීම | ▪ මහසොහොන් බලකායේ නායක අමිත් වීරසිංහ ඇතුළු තවත් 9 දෙනෙකු අත්අඩංගුවට ගනු ලැබීය.[35] කෙසේ වුවද ඔවුන් අත්අඩංගුවට ගත්තේ කවර නීතියක් යටතේ ද යන්න පැහැදිලි නැත. |

| | | |
|---|---|---|
| | තාවකාලිකව සීමා කළේ එය මැර කණ්ඩායම් සංවිධානය කිරීමේ උත්සාහයන් සහ මුස්ලිම් විරෝධී වාචාල කථාවන් පැතිරවීම වැළැක්වීම සඳහා බව පවසමිනි. පහර දීම්, වෛරී ප්‍රකාශණ මෙන් ම උත්තේජක වීඩියෝ පට කිහිපයක් වේගයෙන් ව්‍යාප්ත වීම මීට හේතු වූ බව ද එහි දී ප්‍රකාශ කෙරිණි.[32] හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් නව හදිසි අවස්ථා රෙගුලාසි (ඊආර්) නිකුත් කලේ ය.[33] (ඊආර්එස් පිළිබඳ වැඩි විස්තර සඳහා 1.4 කොටස බලන්න)<br>▪ මැර පිරිස් මුස්ලිම් ජාතිකයන් සතු ව්‍යාපාර හා පූජනීය ස්ථානවලට පහර දුන් අතර මරණ දෙකක් වාර්තා විය.[34] | ▪ වාර්තා වන අන්දමට අයි සී සී පී ආර් පනත යටතේ කිසිවෙකු අත්අඩංගුවට ගෙන නැත.[36] |
| 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයට පසුව හලාවත, ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල සිදු වූ ප්‍රහාර | ▪ රටේ මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ප්‍රචණ්ඩ ක්‍රියා කිහිපයක් සිදුවිය. පළමු ප්‍රචණ්ඩත්වය හලාවත ප්‍රදේශ යේ සිදු වූයේ මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් ජාතිකයන් සතු වෙළඳසැල් කිහිපයකට ගල් ගැසීමෙනි. පසුව වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්මාන කිහිපයකට මැරයන් පහර දී නිවාස, දේපළ හා මුස්ලිම් පල්ලි විනාශ කළහ.<br>▪ මුලින් කුරුණෑගල ප්‍රදේශයේ පැනවූ පොලිස් ඇඳිරි නීතිය පසුව මුළු රටටම ව්‍යාප්ත විය.[37]<br>▪ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට පෙර සිටම මුස්ලිම් වෛද්‍යවරයෙකු විසින් බෞද්ධ කාන්තාවන් වඳ්‍යාකරණයට ලක් කළ බවට චෝදනා එල්ල විය.[38] මෙම චෝදනාවට අදාළව බොදුබල සේනා සංවිධානයේ මහලේකම්වරයා විසින් පවත්වන ලද කථාවක දී එවැනි පුද්ගලයින්ට ගල් ප්රහාර එල්ල කළ යුතු බවට කළ ප්‍රකාෂය 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට පදනම වූ බවට 2019 අප්‍රේල් පාස්කු ප්‍රහාරයෙන් පසු හිටපු ජනාධිපතිවරයා හදිසි නීතිය ප්‍රකාශයට පත් කර නව ඊආර් | ▪ මහසොහොන් බලකායේ නායක අමිත් වීරසිංහ 'සාමය කඩ කිරීම්' හේතුවෙන් ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් අතර මහජන ආරක්ෂක ආඥා පනතේ සහ හදිසි නීති රෙගුලාසි වල විධිවිධාන යටතේ විමර්ශනය කරන ලද බව වාර්තා වේ.[40]<br>▪ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් නව සිංහල ජාතික සංවිධානයේ අධ්‍යක්ෂ ඩෑන් ප්‍රියසාද් අත්අඩංගුවට ගනු ලැබීය.[41]<br>▪ පසුව මිනුවන්ගොඩ සහ ගම්පහ ප්‍රදේශවල ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් අයිසීසීපීආර් පනත යටතේ සැකකරුවන් අත්අඩංගුවට ගත් බව වාර්තා විය.[42]<br>▪ කෙසේ වෙතත්, මෙම වැරදිකරුවන්ට එරෙහිව නඩු පවරා තිබේද යන්න පිළිබඳව ප්‍රසිද්ධ තොරතුරුවල හිඟයක් පවතී. |

| | | |
|---|---|---|
| | නිකුත් කළේය.[39] (ERs පිළිබඳ වැඩි විස්තර සඳහා 1.4 කොටස බලන්න)චෝදනා එල්ල විය. | |

*(ii). අයිසීසීපීආර් පනත අනවශ්‍ය පුළුල් බවකින් යොදවා ගැනීම.*

පසුගිය කාලය මුළුල්ලේ ම අයිසීසීපීආර් පනත අනවශ්‍ය පුළුල් බවකින් යොදවා ගැනීම සම්බන්ධයෙන් වාර්තා විය. අයි සී සී පී ආර් පනතේ 3 වන වගන්තිය මඟින් සමාජ මාධ්‍ය තුළ වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වය ඇති කිරීම සඳහා හේතු වන ජාතික, ආගමික හෝ වාර්ගික වෛරය වෙනුවෙන් පෙනී සිටින ප්‍රකාශ සහ වැරදි තොරතුරු ව්‍යාප්ත කිරීම නියාමනය කිරීමට භාවිතා කළ හැකිය. කෙසේ වෙතත්, වගන්තිය තුළ භාවිතා කරන අපැහැදිලි පාරිභාෂික වචන හේතුවෙන් (නිදසුනක් ලෙස 'සතුරුකම' හෝ 'වෙනස් කොට සැලකීම' යන වචනය), මෙම නියමයන් පිළිබඳ පුළුල් අර්ථකථනයක් තුළින් නීතිය අපයෝජනය කිරීමට රජයට හැකි වේ.සිද්ධිමය උදාහරණ සඳහා පහත වගුව බලන්න.

වගුව 2:අයිසීසීපීආර් පනත අනවශ්‍ය පුළුල් බවකින් යොදවා ගත් බවට සිද්දීමය උදාහරණ.

| සිද්ධිමය උදාහරණය | සිදුවීම පිළිබඳ විස්තර | අයිසීසීපීආර් පනත යෙදෙන අයුරු |
|---|---|---|
| කතුවරයෙකු සහ කවියෙකු වන ශක්තික සත්කුමාර අත්අඩංගුවට ගැනීම (2019 අප්‍රේල්) | ▪ 'අර්ධ නම්' කෙටිකතාව ෆේස්බුක් හි පළ කරන ලදී. ප්‍රබන්ධ කෙටිකතාවක් වූ මෙය බෞද්ධ පූජකයන්ගේ සාමාජිකයෙකු සම්බන්ධ ලිංගික අපයෝජනයන් ගැන සඳහන් කරන්නකි.[43]<br>▪ මෙම කෙටිකතාව 'බුද්ධාගමට නින්දා සහගත හා අපහාසාත්මක බවත්, 'බුදුන් වහන්සේගේ ජීවිත කතාවට සහ මහා සංඝයාට මෙතුලින් නිගරු වන බවටත් පැමිණිලි කෙරිණි.[44] | ▪ අයිසීසීපීආර් පනතේ 3 වන වගන්තිය සහ දණ්ඩ නීති සංග්‍රහයේ 291 වන වගන්තිය යටතේ අත්අඩංගුවට ගැනිණි. දින 130 ක් රිමාන්ඩ් භාරයේ පසුවිය.[45] |
| අබ්දුල් රහීම් මසහීනා අත්අඩංගුවට ගැනීම, (2019 මැයි) | ▪ මුස්ලිම් කාන්තාවක් නැවේ හිස්වැස්මේ ලාංඡනයෙන් සරසා ඇති ඇඳුමක් ඇඳ සිටි අතර එම ලාංඡනය පූජනීය බෞද්ධ සංකේතයකට ('ධර්ම චක්‍රයට') සමාන බව පවසමින් අත්අඩංගුවට ගනු ලැබීය.[46] | ▪ අයිසීසීපීආර් පනතේ 3 වන වගන්තිය යටතේ අත්අඩංගුවට ගැනිණි. |
| රම්සි රසීක් අත්අඩංගුවට ගැනීම (2020 අප්‍රේල් | ▪ රසීක් සිය පෞද්ගලික ෆේස්බුක් ගිණුම මගින් විවිධ අදහස් ඉදිරිපත් කර තිබූ අතර[47] මුස්ලිම්වරුන්ට එරෙහිව වෛරය පැතිරවීමේ සන්දර්භය තුළ 'දෘෂ්ටිවාදාත්මක ජිහාඩ්' වල වැදගත්කම ෆේස්බුක් සටහනක් මගින් අවධාරණය කරන ලදී.[48] | ▪ අයිසීසීපීආර් පනත සහ පරිගණක අපරාධ පනත යටතේ අත්අඩංගුවට ගත් බව වාර්තා වේ.[49] |

අයිසීසීපීආර් පනතේ 3 වන වගන්තිය මගින් සමාජ මාධ්‍යවල වෙනස්කම් කිරීම, ප්‍රචණ්ඩත්වය සහ සතුරුකම් කිරීමට පොළඹවන ජාතික, ආගමික හෝ වාර්ගික වෛරය වෙනුවෙන් පෙනී සිටින ප්‍රකාශන සහ වැරදි තොරතුරු පැතිරවීම නියාමනය කළ හැකිය. කෙසේ වෙතත්, ගැටළුව පවතින්නේ අයිසීසීපීආර් පනතේ 3 වන වගන්තිය සැකසීම තුළ ය. එක් අතකින්, එහි විෂය පථය පුළුල් වන අතර, 'සතුරුකම' වැනි ප්‍රධාන පදවල නිශ්චිත සීමාවන් නිර්වචනය කර නොමැත. 3 වන වගන්තියේ පුළුල් විෂය පථය අපයෝජනයට ගොදුරු විය හැකිය. අනෙක් අතට, එය ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම සහ වෙනස් කොට සැලකීමට පෙළඹවීම වැනි කඨන වැරදි කිහිපයක් ඒකාබද්ධ කරන අතර, සියලු වැරදි සඳහා එකම දඬුවම නියම කරයි (බරපතල වැඩ ඇතිව වසර දහයක උපරිමයකට බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කිරීම). සාපේක්ෂව අඩු හානිකර වෛරී ප්‍රකාශ (උදා: මුස්ලිම් ව්‍යාපාර වර්ජනය කරන ලෙස ඉල්ලා සිටීම) සමඟ ප්‍රබල හානියක් සිදු කල හැකි වෛරී ප්‍රකාශ (උදා, ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම) එක ලෙස සැලකීම ගැටළු සහගතය. මෙම වැරදි දෙකම සම්බන්ධයෙන් නීතිය බලාත්මක කල යුතු වුවත් , අඩු බලපෑමක් සහිත වැරදි සඳහා අනිවාර්ය සිර දඬුවම් නියම කිරීම අසමානුපාතික බවක් ගනී.

## 1.2. 1883 අංක 2 දරන දණ්ඩ නීති සංග්‍රහය

දණ්ඩ නීති සංග්‍රහයේ XV වන පරිච්ඡේදය ආගමට එරෙහි අපරාධ සම්බන්ධයෙන් ප්‍රතිපාදන දක්වා සිටී., අන් අයගේ ආගමික හැඟීම් රිදවීමේ ඒකාන්ත අදහස ඇතිව සිදු කරන ප්‍රකාශයන් සීමා කිරීමට නිශ්චිත විධිවිධාන දෙකක් එහි අන්තර්ගත ය.

- 291 අ වගන්තිය අනුව ආගමික හැඟීම් රිදවීමට හිතාමතාම අදහස් කරන වචන ප්‍රකාශ කිරීම වසරක කාලයක් දක්වා වන බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ දෙකෙන් ම දඬුවම් ලැබිය හැකි වරදකි.[50]
- 291 ආ වගන්තිය අනුව ආගමික හැඟීම් රිදවීමේ අදහස ඇතිව දැඩි සහ ද්වේශ සහගත ලෙස ඕනෑම පන්තියක ආගමට හෝ ආගමික විශ්වාසයන්ට අපහාස කිරීම වසර 2ක් දක්වා බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ දෙකෙන් ම දඬුවම් ලැබිය හැකි වරදකි.[51]

මෙම විධිවිධාන දෙකම වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වයට පොළඹවන ආගමික වෛරය උදෙසා වන ප්‍රකාශන ආවරණය කෙරෙන ලෙස අර්ථ නිරූපණය කළ හැකිය.[52] කෙසේ වෙතත්, දණ්ඩ නීති සංග්‍රහයේ 291(අ) සහ 291(ආ) යන වගන්ති දෙකම පදනම් කරගනිමින් නීති දේහයක් ගොඩනැගී නොතිබීම මෙහි ඇති දුර්වලතාවයකි.[53]

දණ්ඩ නීති සංග්‍රහයේ 120 වන වගන්තිය 'විරුද්ධත්වය ඇවිස්සීම හෝ විරුද්ධත්වය සහිත හන්ගීම් ඇවිස්සීමට තත් කිරීම සම්බන්ධයෙන් ද අදාළ වේ. අත්අඩංගුවට ගැනීම සඳහා මෙම ප්‍රතිපාදනය භාවිත කර ඇති ලේඛනගත අවස්ථා කිහිපයක් අපට හඳුනා ගත හැකිය.[54] එක් අවස්තාවක ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කර සිටියේ 120 වන වගන්තියේ 'හරය' යනු ප්‍රශ්නගත වචන ප්‍රචණ්ඩ ක්‍රියා සහ කලබල සිදුකිරීමට ජනතාව පොළඹවනවාද යන්න මිස එම වචන අපහාසාත්මකද නැද්ද යන්න නොවන බවයි.[55] පවතින ප්‍රවෘත්ති වාර්තා අනුව පෙනී යන්නේ රජයට එරෙහි මත එල කරන ජනමාධ්‍යවේදීන් / ආයතනවල ප්‍රකාශන මර්ධනය කිරීම සඳහා 120 වන වගන්තිය වැඩිපුරම භාවිතා කර ඇති බවයි. මෙය පොදු නීතියේ එන රාජද්‍රෝහී වීම යන වරදට සමාන ය.[56] දණ්ඩ නීති සංග්‍රහයේ අදාළ වගන්ති යෙදීම පිළිබඳ උදාහරණ සඳහා වගුව 3 බලන්න.

වගුව 3: දණ්ඩ නීති සංග්‍රහය යොදා ගැනීම සම්බන්ධ සිද්ධිමය උදාහරණ.

| අදාළ වගන්තිය | සිදුවීම | නීතිය අදාළ වූ ආකාරය |
|---|---|---|
| **291 (ආ)** | **නයෝමි මිෂෙල් කොක්මන් නඩුව, (2017)[57]** | ▪ අත්අඩංගුවට ගැනීම සඳහා සාධාරණ පදනමක් නොමැති බව |

| | | |
|---|---|---|
| | ▪ වූදිත කාන්තාව බ්‍රිතාන්‍ය පුරවැසියෙකු වූ අතර ඇය බුදුරජාණන් වහන්සේගේ රුව සහිත පච්චයක් බාහුවෙහි සටහන් කරගෙන සිටියේ 'බෞද්ධ ඉගැන්වීම් කෙරෙහි ඇය දැක්වූ භක්තියේ පෞද්ගලික ප්‍රකාශයක් ලෙසය.[58]<br><br>▪ ශ්‍රී ලංකාවට පැමිණි පසු ඇය අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන, රඳවාගෙන, අවමන් සහගත සැලකිලිවලට ලක් කොට පසුව පිටුවහල් කරන ලදී. | ශ්‍රේෂ්ඨාධිකරණය නිරීක්ෂණය කළේය. තම බී වාර්තාව ගැන සඳහන් කරමින් මෙම නඩුවේ පෙත්සම්කාරියට ආගමික හැඟීම් කුපිත කිරීමට කිසිදු අදහසක් නොතිබූ බව පොලීසිය විසින්ම පිළිගන්නා ලදී.<br><br>▪ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12 (1) සහ 13 (1) වගන්ති යටතේ පෙත්සම්කාරියගේ මූලික මානව අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බව අධිකරණය විසින් පිළිගත් අතර, පෙත්සම්කාරියට වන්දි ගෙවන ලෙස රජයට සහ නඩුවේ වගඋත්තරකරුවන්ට නියෝග කළේය. |
| **යොදාගත් ප්‍රතිපාදනය අපැහැදිලිය** | **කොවිඩ් -19 කාලය තුළ අසත්‍ය තොරතුරු පැතිරවීම**<br><br>▪ COVID-19 සම්බන්ද ජනාධිපති කාර්ය සාධක බලකායේ ප්‍රධානියා ලෙස බැසිල් රාජපක්ෂ මහතා පත් කිරීම විවේචනය කිරීම සම්බන්ධයෙන් පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන තිබේ.[59]<br><br>▪ වසංගතය තුරන් කිරීම සම්බන්ධ නිරෝධායන වැඩසටහනේ දී සිදු වූ 'අයුක්තිය' සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විවේචනය කිරීම සඳහා ෆේස්බුක් භාවිතා කිරීම සම්බන්ධයෙන් පුද්ගලයෙකු අත්අඩංගුවට ගනු ලැබීය.[60]<br><br>▪ ෆේස්බුක් හි ජනාධිපතිවරයාට COVID-19 ආසාදනය වී ඇති බවට චෝදනා කරමින් පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන තිබේ.[61] | ▪ දණ්ඩ නීති සංග්‍රහය සහ පරිගණක අපරාධ පනත යටතේ අත්අඩංගුවට ගත් බවට වාර්තා වේ. නමුත් එකී අත්අඩංගුවට ගැනීම් සිදු කලේ කවර වගන්ති යටතේ ද යන්න පැහැදිලි නැත. |

මෑතකදී ශක්තික සත්කුමාර අත්අඩංගුවට ගැනීම සම්බන්ධව 291 බී වගන්තිය භාවිතා කළ බව වාර්තා වේ (අයිසීසීපීආර් පනත යටතේ වගුව 2 බලන්න). දණ්ඩ නීති සංග්‍රහයේ අදාල 291 (ආ) සහ 120 යන වගන්ති සමාජ මාධ්‍ය සන්දර්භය තුළ බලාත්මක කළ හැකි අතර ම එසේ බලාත්මක කල අවස්ථා ද පවතී. මෙම කොටස්වල විෂය පථය සීමා කිරීමට උත්සාහ කරන කිසිදු අංගයක් ප්‍රතිපාදන තුළ නොමැත. ගැටළුව පැන නගින්නේ 'ආගමික හැඟීම් කෝපයට පත් කිරීම', 'අතෘප්තිය හෝ අතෘප්තිය' සහ 'අයහපත් කැමැත්ත පිළිබඳ හැඟීම් ප්‍රවර්ධනය කිරීම' වැනි විධිවිධාන තුළ ඇති නියම විෂය පථය හා අර්ථ නිරූපණය පිළිබඳ පැහැදිලි බවක් නොමැති වීමෙනි. එවැනි අවිනිශ්චිතතාවයන් නීතිය වැරදි ලෙස යෙදවීමට මෙන් ම භාෂණයේ අයිතිය අත්තනෝමතික ලෙස සීමා කිරීමට හේතු විය හැක.

### 1.3. 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත

පොලිස් ආඥා පනතේ 98 වගන්තිය අනුව ශ්‍රී ලංකාව තුළ ඕනෑම ස්ථානයක වැසියන් බිය ගැන්වීම සහ 'භීතියක්' ඇති කිරීමේ අදහසින් ව්‍යාජ වාර්තා පතුරවන ඕනෑම පුද්ගලයෙකු වැරදිකරුවකු වේ.[62] තවද, මෙම ප්‍රතිපාදනය සමාජ මාධ්‍යවල ව්‍යාජ වාර්තා පැතිරවීම ආවරණය වන පරිදි එය පුළුල්ව අර්ථ නිරූපණය කිරීමේ හැකියාව පවතී. කෙසේ වෙතත්, මෙම ප්‍රතිපාධනය යටතේ කිසිවෙකු අත්අඩංගුවට ගත බවට හෝ චෝදනා ගොනු කල බවට පවතින ප්‍රසිද්ද තොරතුරු සීමිතය. COVID-19 වසංගතය පැතිර යාමත් සමඟ, වැඩබලන පොලිස්පතිවරයා වෙත මානව හිමිකම් කොමිෂන් සභාව යොමු කරන ලද ලිපියක සඳහන් වූයේ කොවිඩ්-19 සමය තුල සිදු කල වැරදි තොරතුරු බෙදාහැරීම්වලට අදාළ ණඩු කටයුතු හා සම්බන්ද පොලිස් 'බී' වාර්තාවල පොලිස් ආඥා පනතේ 98 වන වගන්තිය සඳහන් කර ඇති බවයි. [63] මානව හිමිකම් කොමිෂන් සභාවේ මෙම සන්නිවේදනය වැරදි තොරතුරු පතුරුවා හැරීම සම්බන්ද අත්අඩංගුවට ගැනීම්වලට 98 වගන්තිය පදනම් කර ගත් බවට සාක්ෂි සපයයි.

### 1.4. 1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥා පනත

මහජන ආරක්ෂණ ආඥා පනත හදිසි නීති රෙගුලාසි බලාත්මක කිරීම හෝ මහජන ආරක්ෂාව, මහජන සාමය ආරක්ෂා කිරීම සහ අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා නඩත්තු කිරීම සඳහා වෙනත් ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ද ප්‍රතිපාදන සපයයි.[64] මහජන ආරක්‍ෂාව, මහජන සාමය ආරක්ෂා කිරීම, කැරලි, කෝලාහල හෝ සිවිල් මහජන කැළඹීම් මර්දනය කිරීම මෙන්ම, ජන ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා නඩත්තු කිරීම අවශ්‍ය හෝ කඩිනම් බව දක්නට ඇති විට, හදිසි නීති රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට ජනාධිපතිවරයාට බලතල පවතී.[65] ජන ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වාගෙන යාම, පුද්ගලයන් රඳවා තබා ගැනීම, ඇතුළුවීම සහ පරික්ෂා කිරීම මෙන්ම, පෞද්ගලික දේපළ අත්පත් කර ගැනීම ඇතුළු අරමුණු උදෙසා හදිසි නීති රෙගුලාසි භාවිතා කල හැකි ය.[66] තවද, මෙම හදිසි නීති රෙගුලාසි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැරුණු විට අනෙකුත් සියලුම නීති අභිබවා යන අතර කිසිදු අධිකරණයක් ඉදිරියේ ප්‍රශ්න කළ නොහැක.[67]

පසුගිය කාලය තුල ඇති වූ හදිසි අවස්ථා වලදී, හදිසි නීති රෙගුලාසි කිහිපයක් නිකුත් කර ඇත.[68] මෑත කාලීනව නිකුත් කරන ලද රෙගුලාසිවල ව්‍යාජ තොරතුරු පැතිරීම තහනම් කර ඇති බවට උදාහරණ පවතී. නිදසුනක් ලෙස, 2018 දී දිගන ප්‍රචණ්ඩක්‍රියා අතරතුර, නිකුත් කරන ලද හදිසි නීති රෙගුලාසීන් හී 15 වන රෙගුලාසිය මඟින් කිසියම් කටකතාවක්, අසත්‍ය ප්‍රකාශයක්, තොරතුරක්, ඡායාරූපයක් හෝ පණිවිඩයක් සන්නිවේදනය කිරීම හෝ ව්‍යාප්ත කිරීම මඟින් ජනතාවට අනතුරු ඇඟවීමක්, මහජන කැළඹීමක්, වාර්ගික ප්‍රචණ්ඩක්‍රියාවක් හෝ වරදක් කිරීමට පෙළඹවීම අපරාධයක් බවට නම් කරන ලදී.[69] මෙම විධිවිධානය මඟින් පැහැදිලිවම සන්නිවේදන ක්‍රම ආවරණය වූ අතර ඊට 'ඩිජිටල් සහ සමාජ මාධ්‍ය' ඇතුළත් විය. 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් ඉක්බිතිව, නිකුත් කරන ලද හදිසි නීති රෙගුලාසි 2018 දී නිකුත් කරන ලද හදිසි නීති රෙගුලාසි වලට සමාන විය. මීට අමතරව, එය ත්‍රස්තවාදය සමඟ කටයුතු කිරීම සඳහා විධිවිධාන සලසා තිබිණි.[70] මෙම විධිවිධානය තුළ සමාජ මාධ්‍ය ගැන විශේෂයෙන් සඳහන් කර නොතිබුණද, 'වෙනත් ඕනෑම ආකාරයක', සන්නිවෙධනයක් ආවරණය වන බව එහි ප්‍රකාශ විය. එය සියලු ආකාරයේ සන්නිවේදනයන් ආවරණය කිරීමට තරම් පුළුල් වූවකි.

ප්‍රචණ්ඩත්වයට හා ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ප්‍රතිචාර වශයෙන් මෑත කාලීන හදිසි නීති රෙගුලාසි තුළ සමාජ මාධ්‍යවල අන්තර්ගතය ආවරණය කළ හැකි පුළුල් භාෂාවක් ඇතුළත් වේ. මෙම පුළුල් භාවය සමාජ මාධ්‍ය නියාමනය කිරීම සඳහා නීති රාමුව සම්පාධනය කර තිබුන ද, හදිසි නීති රෙගුලාසි අනිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ඉතිහාසය අනුව එය ගැටළු සහගත විය හැකිය.[71]

### 1.5. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත

පනතේ 58 වගන්තිය අනුව තනිවම හෝ නියෝජිතයෙකු මාර්ගයෙන් 'අශෝභන, අසභ්‍ය, දේශද්‍රෝහී, බියජනක, තර්ජනාත්මක හෝ ඉතා ද්වේශ සහගත පනිවිඩයක් ඕනෑම විදුලි සංදේශ කාර්යාලයක් හරහා

සම්ප්‍රේෂණය කිරීම වරදක් වේ.[72] විශේෂයෙන්, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වයට පොළඹවන ජාතික, ආගමික හෝ වාර්ගික වෛරය වෙනුවෙන් පෙනී සිටින ප්‍රකාශන සහ වැරදි තොරතුරු ආවරණය කිරීම සඳහා මෙම විධිවිධානය අර්ථ නිරූපණය කළ හැකිය. පනතේ 69 වගන්තිය අනුව 'මහජන හදිසි අවස්ථාවක් උදාව ඇති විට හෝ මහජන ආරක්ෂාව සහ සන්සුන් භාවය පවත්වා ගෙන යා යුතු විට විදුලි සංදේශ පණිවිඩ සම්ප්‍රේෂණය සහ ප්‍රතිග්‍රහණය තහනම් කිරීමට හෝ සීමා කිරීමට රජයට බලය ලබා දෙයි.[73]

පනතේ භාවිතය මෙන්ම ඒ යටතේ ඇති බලතල ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ගත් කල, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ටී ආර් සී එස් එල් )විවිධ හේතූන් මත අන්තර්ගතයන් අවහිර කර ඇති අවස්ථා පවතී. උදාහරණයක් ලෙස, 2015 සිට 2018 දක්වා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මඟ පෙන්වීම යටතේ (2017 දී Lankaenews වෙබ් අඩවිය වැනි) වෙබ් අඩවි කිහිපයක් අවහිර කර ඇති බව වාර්තා විය. ග්‍රවුන්ඩ්වීව්ස් විසින් තොරතුරු දැන ගැනීමේ අයිතිය යටතේ සිදු කල ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අනාවරණය කළේ 'වැරදි තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සහ ජනාධිපතිවරයාගේ කීර්ති නාමයට හානි කිරීම' යන චෝදනාව මත තවත් වෙබ් අඩවි හතරක් අවහිර කර ඇති බවයි. ඊට අමතරව තවත් වෙබ් අඩවි දෙකක් 'ව්‍යාජ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම' මත අවහිර කර තිබිණි. මෙම වෙබ් අඩවි අවහිර කිරීම් සම්බන්ධයෙන් කිසිඳු හේතු දැක්වීමක් සිදු කර නොතිබිණි. [74] 2018 දී දිගන ප්‍රදේශයේ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සහ 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයන්ට ප්‍රතිචාර වශයෙන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීමකට අනුකූලව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් වඩාත් මෑතකදී තාවකාලික සමාජ මාධ්‍ය සීමා කිරීම් බලාත්මක කරන ලදී.[75] 'වැරදි තොරතුරු පැතිරීම වැළැක්වීම' සඳහා එවැනි සමාජ මාධ්‍ය සීමාවන් පනවා තිබුණි.[76]

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සම්බන්ධ ප්‍රධාන කාරණයක් වන්නේ මෙම ආයතනය දේශපාලනීකරණය කිරීමයි. එහි සභාපතිවරයා ලෙස ජනාධිපති ලේකම්වරයා කටයුතු කළ අවස්ථා ඇති අතර එය මෙම ආයතනයේ ස්වාධීනත්වය පිලිබඳ ප්‍රශ්න මතු කරන්නකි.[77] 2019 මාර්තු මාසයේදී හිටපු ජනාධිපතිවරයා ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථය යටතේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය පාලනය යටතට පත් කළේය.[78] එසේම, නව ජනාධිපති ගෝඨාබය රාජපක්ෂ තේරී පත්වීමෙන් පසු 2019 දෙසැම්බර් මාසයේදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා එහි සභාපති ලෙස පත් කරන ලදී.[79] එහි විෂය පතයට සමාජ මාධ්‍ය අන්තර්ගත වන බව පැහැදිලි කරුණකි. කෙසේ වෙතත්, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දේශපාලනීකරණය වීම සහ එහි අතිශය පුළුල් වූ විෂය පථය සමාජ මාධ්‍ය නියාමනය පිණිස අසමානුපාතික ලෙස යොදා ගත හැකි ය.

## 1.6. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පාර්ලිමේන්තුව හරහා 'හදිසි පනත් කෙටුම්පතක්' ලෙස නීතිගත කරන ලද අතර එහි ප්‍රතිඵලය වූයේ මහජනතාවට සිය අදහස් හෝ විරෝධය දැක්වීමට අවස්ථාවක් නොලැබීමයි.[80] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වසර තුනක් යන තුරු ත්‍රස්තවාදී තර්ජනවලට මුහුණ දීම සඳහා තාවකාලික ප්‍රතිපාධන සපයමින් විශේෂ නීතියක් ලෙස පනවන ලද අතර, ඉන් පසුව එය ස්ථිර බවට පත් විය.[81]

පනතේ 2 (1) (ඌ)) වගන්තිය අනුව වචන, සළකුණු, දෘශ්‍ය නිරූපණයන් හෝ වෙනත් ආකාරයකින්, 'ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කිරීමට, ජාතික, ආගමික හෝ වාර්ගික අසමගිය ඇති කිරීමට හෝ විවිධ ප්‍රජාවන් අතර ජාතිවාදී හෝ ආගමික වශයෙන් අයහපත් තත්වයන් හෝ සතුරුකම් පිළිබඳ හැඟීම් ඇති කිරීම හෝ ඇති කිරීමට උත්සාහ කිරීම වරදක් වේ. ඉහත 2 වන වගන්තියෙන් හඳුනාගෙන ඇති වැරදි සිදු කිරීමට අනුබල දෙන, කුමන්ත්‍රණය කරන හෝ පොළඹවන පුද්ගලයන්ට ද මෙම පනත මගින් දඬුවම් කල හැකිය.[82] මෙම කොටස නිශ්චිත සන්නිවේදන ක්‍රමවලට පමණක් සීමා නොවන බැවින් සමාජ මාධ්‍ය වේදිකාවල සිදු කෙරෙන වෛරී කථනයන් ආවරණය කිරීම දක්වා ව්‍යාප්ත කළ හැකිය. තවද, එහි 14 වන වගන්තිය මඟින් ඕනෑම පුද්ගලයෙකු සිදු කරන මුද්‍රණ හෝ ප්‍රකාශණ නියමිත කොන්දේසිවලට

යටත්ව සිදු කල යුතු බවට නියෝග කල හැකි අතර[83] විවිධ ජන ප්‍රජාවන් අතර ආගමික, වාර්ගික හෝ වාර්ගික අසමගිය හෝ අයහපත් අදහස් හෝ හැඟීම් ඇතිවීමට තුඩු දිය හැකි හෝ ඒ සඳහා පෙළඹවිය හැකි ඕනෑම කරුණක් නිසි බලධාරියෙකුගේ අනුමැතියකින් තොරව එළ කිරීම වරදක් වේ.[84]

පනතෙහි අදාලත්වය අතින් බලන කල, එය නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට යම් ස්ථානයකට ඇතුළුවීම, පරික්ෂා කිරීම, අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් පුළුල් බලතල ලබා දේ. රඳවා තබා ගැනීමේ සහ සීමා කිරීමේ නියෝග සඳහා පනත තවදුරටත් ප්‍රතිපාධන සපයයි. මෙම පනතේ විධිවිධාන ජනමාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂා කරන්නන් සහ දේශපාලන ක්‍රියාකාරීන් ඇතුළු කිහිප දෙනෙකුට ම එරෙහිව අසමානුපාතික ලෙස භාවිතා කර ඇත.[85] වසර 2008 දී සිදු වූ තිස්ස නායගම් සම්බන්ධ සිදුවීම පනතේ 2 (1)(ඌ) වගන්තිය ()) වැරදි ලෙස භාවිතා කළ අවස්ථාවකට උදාහරණ සපයයි.

තිස්සනායගම් සඟරාවක කර්තෘවරයෙකි. ඔහු ප්‍රචණ්ඩත්වය සහ ජාතික හෝ ජනවාර්ගික අසමගිය අවුළුවන අන්දමේ ලිපි එළ කිරීම සම්බන්ධයෙන් ත්‍රස්ත විමර්ශන අංශය විසින් අත්අඩංගුවට ගනු ලැබිණි. 2009 දී ඔහුට වසර 20 ක බරපතල සිර දඬුවමක් නියම විය. නඩු විභාගයේදී සාක්ෂි ලෙස 'අවුල් සහගත' පාපොච්චාරණයක් භාවිතා කිරීම සහ අදාළ ලිපි ජනවාර්ගික අසමගිය ඇති කළ හැකි බව ඔප්පු කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් නඩුව විවේචනයට ලක්විය.[86]

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා 2018 දී ත්‍රස්ත විරෝධී පනත නමින් නව පනත් කෙටුම්පතක් යෝජනා කරන ලදී. කෙසේ වෙතත්, පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගැනීමේ තීරණය 2020 ජනවාරි 3 වන දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී.[87]

## 1.7. 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත

පනතේ 6 වන වගන්තිය අනුව කිසියම් පුද්ගලයෙකු පරිගණකයක් යොදා ගනිමින් (අ) ජාතික ආරක්ෂාවට, (ආ) ජාතික ආර්ථිකයට හෝ (ඇ) මහජන සාමයට හානියක් හෝ අනිවාර්ය හානියක් ගෙන දෙන අන්දමේ ක්‍රියාකාරකමක චේතනාන්විතව හෝ දැනුවත්ව යෙදී සිටීම වරදක් වේ.[88] COVID-19 ට අදාළව 'සමාජ මාධ්‍ය හරහා වැරදි තොරතුරු' පතුරුවා හැරීම සම්බන්ධයෙන් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සඳහා 2020 මාර්තු මාසයේදී මෙම පනත භාවිතා කරන ලදී.[89] සමාජ මාධ්‍ය තුල සිදු කෙරෙන වෛරී කථනය සම්බන්ධයෙන් 2020 ජූලි මස දක්වා පනතේ ප්‍රතිපාධන විශේෂයෙන් භාවිතා කල බවට වාර්තා නොපවතී. එසේ වුවද, 2020 වසරේ දී සිදු වූ සිදුවීම් පෙන්නුම් කරන්නේ මෙම පනත යොදා ගැනීම මගින් සමාජ මාධ්‍යවල සිදුවන වෛරී කථන ස්වරූපයන් ආවරණය කළ හැකි බවයි.

## 1.8. වෙනත් නියාමන යාන්ත්‍රණ සහ ආයතන

### *1.8.1. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) / සම්බන්ධීකරණ මධ්‍යස්ථානය*

2006 දී පිහිටුවන ලද[90] ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය රාජ්‍ය ආයතනයක් වන අතර එය දැනට ක්‍රියාත්මක වන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ය.[91] ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය විසින් රටේ පරිගණක පද්ධති සහ ජාල වලට බලපාන නවතම තර්ජන සහ අනාරක්ෂිතතා පිළිබඳ උපදෙස් සපයයි. සයිබර් ප්‍රහාරයන්ට ප්‍රතිචාර දැක්වීම සහ යථා තත්ත්වයට පත් කිරීම පිළිබඳ විශේෂඥ දැනුම ද එය සපයයි. කෙසේ වෙතත්, සමාජ මාධ්‍යවල සිදුවීම් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය විසින් සපයනු ලබන්නේ සමාජ මාධ්‍ය සිදුවීම් විසඳීම සඳහා තාක්ෂණික සහාය පමණි. එහි වෙබ් අඩවියට අනුව, අපරාධකරුවන් සොයා ගැනීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට එමඟින් සහාය ලබා දෙන්නේ නැත. එය සමාජ මාධ්‍ය වේදිකා හෝ වෙබ් අඩවි අවහිර නොකළ ද, ව්‍යාජ ගිණුම් ඉවත් කිරීම, ගිණුම් හැක් කිරීම සහ සමාජ මාධ්‍ය ජාලා සහ වෙබ් අඩවිවල සාමූහික උපදෙස් සහ රහස්‍යතා ප්‍රතිපත්තිය උල්ලංඝනය කරන අන්තර්ගතයන් වාර්තා කිරීම සඳහා ආයතනික සහාය ලබා දිය හැකිය.

### *1.8.2. අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ අංශය*

ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව (සීඅයිඩී) නිශ්චිත අපරාධ සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණ පවත්වයි. සයිබර් අපරාධවලට එරෙහිව සටන් කිරීම සහ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම වේගවත් කිරීම සඳහා 2015 දී රහස් පොලිසිය විසින් රට පුරා 'අධි තාක්ෂණික අපරාධ විමර්ශන ඒකක' හඳුන්වා දී ඇති බව වාර්තා විය.[92] සමාජ මාධ්‍යවල කාන්තාවන්ට සිදුවන ලිංගික හිරිහැර, ළමයින්ට සිදුවන තර්ජන සහ මූල්‍ය අපරාධ සම්බන්ධයෙන් මෙම ඒකක අවධානය යොමු කරන බව වාර්තා විය.[93] මෙම ඒකකවල ක්‍රියාකාරිත්වය පිළිබඳ පසු විපරම් දත්ත නොමැත. රහස් පොලිසියේ සයිබර් අපරාධ අංශයේ කාර්යය භාරය අපැහැදිලි වන අතර එය ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකි සමාජ මාධ්‍යවල අන්තර්ගතයන් සමඟ විශේෂයෙන් කටයුතු කරන බවක් දක්නට ලැබෙන්නේ නැත.

## 2. විකල්ප නීතිමය නොවන නියාමන රාමුව

රජයේ විධිමත් නියාමන රාමුවෙන් පිටත, සමාජ මාධ්‍යවල වෛරී කථනය සහ වැරදි තොරතුරු වලට එරෙහිව සටන් කිරීමේ විකල්ප ක්‍රම තිබේ. නෛතික ප්‍රතිචාර මෙන් ම වෛරී කථනය සම්බන්ධ නියාමන රාමුවට නෛතික නොවන සමාජීය ප්‍රතිචාර වැදගත් වේ.[94] මෙම කොටස පහත සඳහන් යාන්ත්‍රණයන් සාකච්ඡා කරයි: 1. සමාජ මාධ්‍ය සමාගම් විසින් ස්වේච්ඡාවෙන් සිදු කරන ස්වයං-නියාමනයන්; 2. මාධ්‍ය ක්ෂේත්‍රය තුළින් ම බිහි කරගන්නා ස්වාධීන යාන්ත්‍රණ; 3. සිවිල් සමාජය සහ පෞද්ගලික ආයතන විසින් ප්‍රති-පණිවුඩ යැවීම සහ සදාචාරාත්මකව සම්බන්ධ වීම. ගෝලීය හා දේශීය අත්දැකීම්වලින් පෙනී යන්නේ සාමූහික ප්‍රතිචාර අවශ්‍ය වන තත්ත්වයක් තුළ එක් යාන්ත්‍රණයක් මත පමණක් රඳා සිටීම අකාර්යක්ෂම විය හැකි බවයි.

### 2.1. සමාජ මාධ්‍ය සමාගම් විසින් ස්වේච්ඡාවෙන් සිදු කරන ස්වයං-නියාමනයන්

අනෙකුත් නියාමන යාන්ත්‍රණ අතර, ස්වේච්ඡා ස්වයං-නියාමනය යනු සමාජ මාධ්‍ය සමාගම් විසින් අනුගමනය කරනු ලබන එක් යාන්ත්‍රණයකි.[95] මෙම යාන්ත්‍රණය නෛතික රාමුවක් මත පදනම් වූවක් නොව, මාධ්‍ය කර්මාන්තයේ 'සංවර්ධනය හා විශ්වසනීයත්වය' සඳහා ඉඩ ලබා දීමේ අවශ්‍යතාවය තුළින් ගොඩනැගුනකි.[96] එවැනි ස්වයං-නියාමනයන් හරහා, සමාජ මාධ්‍ය වේදිකා සාමාන්‍යයෙන් ඔවුන්ගේ වේදිකාවලින් අන්තර්ගතය නිරීක්ෂණය කිරීම සහ ඉවත් කිරීම සිදු කරයි. වේදිකාවක සියලුම පරිශීලකයින් පිළිගැනීමට බැඳී සිටින සේවා කොන්දේසි හෝ ප්‍රජා ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා අන්තර්ගතය අධීක්ෂණය කරනු ලැබේ. වේදිකාවේම මූලිකත්වය මත හෝ ප්‍රශ්නගත අන්තර්ගතය වේදිකාවේ ප්‍රජා මාර්ගෝපදේශ උල්ලංඝනය කරන බවට පරිශීලකයින් වෙතින් ලැබෙන පැමිණිලි මත පදනම්ව අන්තර්ගතය ඉවත් කරයි.[97]

### *2.1.1. ප්‍රජා ප්‍රමිතීන්: වෛරී කථනය සහ බලාත්මක කිරීම සඳහා අර්ථ දැක්වීම්*

වැඩි වසයෙන් භාවිතා කරන සමාජ මාධ්‍ය වේදිකාවල ප්‍රජා ප්‍රමිතීන් ඇති අතර එය වෛරි කථන අන්තර්ගතයන් නිර්වචනය කරයි. ෆේස්බුක්, යූටියුබ්, ට්විටර් සහ ඉන්ස්ටග්‍රෑම් හි වෛරී ප්‍රකාශ සම්බන්ධයෙන් අදාළ ප්‍රජා මාර්ගෝපදේශ සහ එය බලාත්මක කිරීම මෙම කොටසේ දක්වා ඇත. 2020 ජූලි මස වන විට වෛරී ප්‍රකාශ පිළිබඳ නිර්වචන සහ ප්‍රජා ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සඳහා 4 වන වගුව බලන්න.

| සමාජ මාධ්‍ය වේදිකාව | අදාළ ප්‍රජා මාර්ගෝපදේශ / ප්‍රතිපත්ති / ප්‍රමිතිය | බලාත්මක කිරීම |
|---|---|---|
| **ෆේස්බුක්** | ▪ **'විරෝධතා දැක්විය හැකි අන්තර්ගතය'** යටතේ, ප්‍රජා මාර්ගෝපදේශ ජාතිය, ජනවර්ගය, ජාතික සම්භවය, ආගමික බැඳීම, ලිංගික දිශානතිය, | ▪ ෆේස්බුක් විසින් අන්තර්ගතය ඉවත් කිරීමට හෝ 'අනතුරු ඇඟවීමේ තිරයකින්' අන්තර්ගතය |

| | | |
|---|---|---|
| facebook | කුලය, ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික අනන්‍යතාවය, බරපතල රෝග හෝ ආබාධිතභාවය යන 'ආරක්ෂිත ලක්ෂණ' මත පදනම්ව වෛරී ප්‍රකාෂ සිදු කිරීම **'මිනිසුන්ට සෘජු ප්‍රහාරයක්'** ලෙස අර්ථ දක්වයි.[98]<br><br>▪ 'ප්‍රහාරය' යන්න **'ප්‍රචණ්ඩකාරී හෝ අමානුෂික හෝ පහත් ප්‍රකාශයක්, බැහැර කිරීම හෝ වෙන් කිරීමට වන කැඳවීමක්'** ලෙස අර්ථ දක්වයි.[99]<br><br>▪ ආරක්ෂිත ලක්ෂණ සම්බන්ධයෙන් පුද්ගලයෙකු හෝ පුද්ගලයින් කණ්ඩායමක් ඉලක්කගතව ඉදිරිපත් කරන අන්තර්ගතයේ බරපතලකම මත පදනම්ව මාර්ගෝපදේශ ස්ථර තුනකට වර්ග කර ඇත.[100] | ආවරණය කිරීමට ඉඩ ඇත.[101]<br><br>▪ වෛරී ප්‍රකාශ සලකුණු කිරීම සඳහා ඔවුන් විසින් අනාවරණ තාක්ෂණය අඛණ්ඩව දියුණු කරමින් සිටී.[102]<br><br>▪ ස්වයංක්‍රීයව' වෛරී ප්‍රකාශය ඉවත් කිරීමෙන් හෝ 'හානිකර අන්තර්ගතය' කල්තියා හඳුනා ගැනීමෙන් ඉවත් කරන්නේ ද යන්න වේදිකාව විසින් තීරණය කරයි.[103] |
| **යූ ටියුබ්** | ▪ **'වෛරී අන්තර්ගතය'** යටතේ, ප්‍රජා මාර්ගෝපදේශ වල විශේෂයෙන් සඳහන් කරන්නේ වෛරී කථාවට ඉඩ නොදෙන බවයි.<br><br>▪ ඇතැම් ගුණාංග මත පදනම්ව පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට එරෙහිව ප්‍රචණ්ඩත්වය හෝ වෛරය ප්‍රවර්ධනය කරන අන්තර්ගතයන් ඉවත් කරනු ලැබේ. මෙම ගුණාංග නම් - වයස, කුලය, ආබාධිතභාවය, ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගිකත්වය ප්‍රකාශනය කරන අන්දම, ජාතිකත්වය, ජාතිය, සංක්‍රමණික තත්වය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය / ලිංගික අනන්‍යතාවය, ලිංගික දිශානතිය, ප්‍රධාන ප්‍රචණ්ඩකාරී සිදුවීමකට ගොදුරු වූවන් සහ ඔවුන්ගේ ඥාතීන් මෙන්ම, ප්‍රවීණ පුද්ගලයන් වේ.[104] | ▪ මූලික අනතුරු ඇඟවීමේ සිට උඩුගත කළ හැකි අන්තර්ගතය සීමා කිරීම දක්වා මාර්ගෝපදේශ පරාසයක පවතී. යූ ටියුබ් හි වෙනත් විශේෂාංග වෙත ප්‍රවේශ වීම සීමා කිරීම හෝ පරිශීලකයාගේ නාලිකාව ඉවත් කිරීමට කටයුතු කළ හැකිය.[105] |

| | | |
|---|---|---|
| ට්විටර් | ▪ 'වෛරී හැසිරීම් පිළිබඳ ප්‍රතිපත්තිය' යටතේ, ජාතිය, ජනවාර්ගිකත්වය, ජාතික සම්භවය, කුලය, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික අනන්‍යතාවය, ආගමික බැඳීම්, වයස, ආබාධිතභාවය හෝ බරපතල රෝග මත පදනම්ව වෙනත් පුද්ගලයින්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කිරීම හෝ සෘජුවම පහර දීම හෝ තර්ජනය කිරීම තහනම් වේ.[106]<br><br>▪ ප්‍රතිපත්තිය මගින් ඒවායේ ප්‍රමිතීන් උල්ලංඝනය වන අන්තර්ගතයන් පිළිබඳ උදාහරණ සපයයි.[107] | ▪ ට්විටර් හි ප්‍රතිපත්ති උල්ලංඝනය කරන අන්තර්ගතයන් සඳහා බලාත්මක කිරීමේ විකල්ප ගණනාවක් තිබේ. මෙම විකල්ප අතර ට්වීට්-මට්ටමේ බලාත්මක කිරීම, සෘජු-පණිවිඩ-මට්ටමේ බලාත්මක කිරීම, ගිණුම් මට්ටමේ බලාත්මක කිරීම සහ උල්ලංඝනය නොවන අන්තර්ගතයට එරෙහිව ක්‍රියා කිරීම ඇතුළත් වේ.[108] |
| ඉන්ස්ටග්‍රෑම් | ▪ "**ඉන්ස්ටග්‍රෑම් ප්‍රජාවේ සෙසු සාමාජිකයන්ට ගරු කරන්න** යන අයිතමය 'යටතේ, මාර්ගෝපදේශ වල සඳහන් වන්නේ තර්ජන හෝ වෛරී කථනය අඩංගු අන්තර්ගතයන් ඉවත් කරන බවයි.<br>▪ ජාතිය, ජනවාර්ගිකත්වය, ජාතික සම්භවය, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගිකත්වය, ලිංගික අනන්‍යතාවය, ලිංගික දිශානතිය, ආගමික බැඳීම්, ආබාධිතභාවය හෝ රෝග මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට හෝ ප්‍රහාරයන්ට දිරිගැන්වීමට ඉඩ නොදේ.[109] | ▪ ඉන්ස්ටග්‍රෑම් විසින් අන්තර්ගතය මකා දැමීම, ගිණුම් අක්‍රිය කිරීම , නැතහොත් භෞතික හානියක් හෝ මහජන ආරක්ෂාවට තර්ජනයක් තිබේ නම් නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ කටයුතු කළ හැකිය.[110] |

සිය සමාජ මාධ්‍ය වේදිකාවල වෛරී කථනයට එරෙහිව සටන් කිරීමට පියවර ගත යුතු බවට සමාජ මාධ්‍ය සමාගම් අතර එකඟතාවයක් ඇති බව පෙනේ.[111] නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාවේ, ෆේස්බුක් විසින් වැරදි තොරතුරු සහ වෛරී කථණයන්ට ප්‍රතිචාර දැක්වීමට පියවර ගෙන තිබේ. විශේෂයෙන්, 2019 මුල් භාගයේදී, ෆේස්බුක් විසින් ශ්‍රී ලංකාවේ සහ අන්තර්ජාල අන්තර්ගතයන් ප්‍රචණ්ඩත්වයට තුඩු දිය හැකි වෙනත් රටවල ගැටළු පිළිබඳව විශේෂයෙන් කටයුතු කිරීම සඳහා කණ්ඩායමක් නිර්මාණය කළ බව වාර්තා විය.[112] කලින් සඳහන් කළ පරිදි, ස්වේච්ඡා අන්තර්ගතය පාලනය කිරීම සම්බන්ධයෙන් භාෂාව අභියෝගයක් වන අතර, සිංහල හා දෙමළ භාෂාවන්හි වැරදි තොරතුරු සහ වෛරී කථාව අධීක්ෂණය හා අනාවරණය කර ගැනීම සඳහා කෘතිම බුද්ධි (AI) පද්ධති ඵලදායී නොවනු ඇත.[113] පර්යේෂක සංජන හත්තොටුව සිංහල හා දෙමළ භාෂාවෙන් වාර්තා කිරීමේ මෙවලම් පිළිබඳ දැනුවත්භාවය සහ ප්‍රවේශය නිර්මාණය කිරීමේදී වේදිකාවේ 'නොනැසී පවත්නා අසමානතාවය' ගැනසිය අවධානය යොමු කළ අතර හානිකර අන්තර්ගතයන් පැතිර යාමට මෙතුළින් කාලය හිමි වන බව පෙන්වා දෙයි.[114]

## 2.2. ස්වාධීන ජාත්‍යන්තර නියාමනය

බොහෝ පාර්ශවකරුවන් සමාජ මාධ්‍ය සඳහා ස්වාධීන ස්වයං-නියාමන යාන්ත්‍රණ ඵලදායී විකල්පයක් ලෙස නිර්දේශ කරයි.[115] ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමින් හෝ ඒ දෙකේම එකතුවක් සහිත කවුන්සිලයක් ඇති කිරීමට ඔවුන් යෝජනා කරයි.[116] උදාහරණයක් ලෙස ආර්ටිකල් 19 හි වාර්තාවක් නිර්දේශ කරන්නේ එවැනි කවුන්සිලයකට අන්තර්ජාලය හරහා අන්තර්ගතය බෙදා හැරීමට විශේෂිත වූ ආචාර ධර්ම ප්‍රමිතීන් සැකසිය හැකි අතර ප්‍රජා මාර්ගෝපදේශ සහ සමාජ මාධ්‍ය සමාගම්වල අන්තර්ගත නියාමන පිළිවෙත් වැනි වෙනත් අංශ ආවරණය කළ හැකි බවයි.[117] තවද, 'සම වයසේ මිතුරන් හා මහජන පීඩනය වැනි සැහැල්ලු සම්බාධක' මත පදනම්ව කවුන්සලයට මහජනතාව සමඟින් සුදුසු උපදේශන ක්‍රියාවලියකට අවතීර්ණ විය හැකිය.[118]

සමාජ මාධ්‍ය නියාමනය කිරීමේදී යෝජනා කරන ලද යාන්ත්‍රණය ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ බොහෝ රටවල මුද්‍රිත මාධ්‍ය නියාමනය කිරීමට භාවිතා කරන යාන්ත්‍රණයට සමානය. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය (එස්එල්පීඅයි) නිර්මාණය කරන ලද්දේ වෘත්තීය පුහුණුවීම් සංග්‍රහය (ආචාර ධර්ම සංග්‍රහය) මත පදනම් වූ මාධ්‍ය ක්‍රියාකාරකම් සඳහා මග පෙන්වීම සහ නායකත්වය සැපයීම පිනිස ය.[119] මෙම වාර්තාව ප්‍රකාශයට පත් කරන වේලාව වන විට ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය ස්වයං-නියාමනය සම්බන්ධ එකම මඟ පෙන්වීම වන්නේ සමාජ මාධ්‍ය ප්‍රකාශනය (2019): වගකිව යුතු සමාජ මාධ්‍ය භාවිතය සඳහා වූ ආචාර ධර්ම පද්ධතියයි. මාධ්‍ය අන්තර්ගතයන් හුවමාරු වන මාර්ගගත වේදිකාවන් ක්‍රියාත්මක කරන සමාජ මාධ්‍ය සමාගම් සඳහා ද එවැනිම ආකෘතියක් යෙදිය හැකිය. රජය, මාධ්‍ය සංවිධාන සහ සිවිල් සමාජය ඇතුළු සමාජ මාධ්‍ය වේදිකාවල වගකීම බහු පාර්ශවීය ස්වභාවයක් ගන්නා බව එය පිළිගනී. එනිසා ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන්, මූලධර්ම හා ආචාර ධර්ම වලට අනුගත වීම සමාජ මාධ්‍ය නියාමනයේ ප්‍රබල ක්‍රමයක් විය හැකිය. මේ සඳහා, ජාත්‍යන්තර ස්වාධීන කවුන්සිලයක් සමහරවිට අදාළ ප්‍රජා ප්‍රමිති වලට මඟ පෙන්වීම, උපදෙස් දීම සහ කලාපීය වශයෙන් පුද්ගලයින්ගෙන් ලැබෙන බරපතල පැමිණිලි විභාග කිරීම සඳහා පිහිටුවනු ලැබිය හැකිය.

## .2.3සිවිල් සමාජය සහ පෞද්ගලික ආයතන විසින් ප්‍රති පණිවුඩ යැවීම සහ සදාචාරාත්මක ප්‍රවේශය-මත සිදුවන සම්බන්ධීකරණය

දැනුවත්භාවය වැඩි දියුණු කිරීම, අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සහ වෛරී කථනයට එරෙහිව සාකච්ඡා කිරීමේ හැකියාව වර්ධනය කිරීම ප්‍රති-කථනය යනුවෙන් තේරුම් ගත හැකිය.[120] ප්‍රති-කථනය බොහෝ විට නිදහස් කථනය මර්දනය කිරීම හෝ සීමා කිරීම වශයෙන් අර්ථ දක්වනු පෙනේ.[121] ප්‍රති-කථනය හෝ ප්‍රති-පණිවිඩ යැවීම (I) ආයතනික සහ(II) තනි පුද්ගල යන මට්ටම් දෙකකින් සිදුවිය හැකිය.

### 2.3.1. ආයතනික මට්ටම: සිවිල් සමාජය, මාධ්‍ය ආයතන සහ ක්‍රියාකාරීන් සිදු කරන ප්‍රති-පණිවිඩ යැවීමේ මූල පිරීම්

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම, වෛරී කථනයට ප්‍රතිරෝධය දැක්වීම හෝ ප්‍රතිචාර දැක්වීම සඳහා සිවිල් සමාජය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.[122] වෛරී කථනයට එරෙහි වීම සහ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ වඩාත් නව්‍ය හා ඵලදායී මාධ්‍යයන් අතර සිවිල් සමාජ මූලාරම්භයන් පවතී.[123] නිදසුනක් වශයෙන්, 2019 ජනාධිපතිවරණ සමයේදී, තරුණ නායකත්වයෙන් යුත් සිවිල් සමාජ සංවිධානයක් වන 'හැෂ් ටැග් ජෙනරේෂන්'[124] භයානක ප්‍රකාශයන්, අසත්‍ය තොරතුරු සහ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් පිළිබඳව සමාජ මාධ්‍ය නිරීක්ෂණය කළේය.[125] ඒ හා සමානව, සමාජ මාධ්‍ය අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ධාරිතාවය ගොඩනැගීමේදී සිවිල් සමාජ සංවිධානවලට සහයෝගීතාව ලබා දීමට හැකියාව පවතින බව පැහැදිලිව පෙනේ.[126]

### 2.3.2. ආයතනික මට්ටම: පෞද්ගලික ආයතන සහ සමාගම් විසින් කරුණු පරීක්ෂා කිරීම සහ සදාචාරාත්මකව සම්බන්ධ වීම

අන්තර්ජාලය හරහා තොරතුරු වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා පෞද්ගලික ආයතන සහ සමාගම්වලට වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකිය. වෛරී කථාවක් විය හැකි වැරදි තොරතුරු සබැඳි කරුණු පරීක්ෂා කිරීමේ වේදිකා මගින් සත්‍යාපනය කළ හැකිය. මෑතදී සිදු වූ සබැඳි වෛරී කථන සහ සාවද්‍ය තොරතුරු වලට ප්‍රතිචාර වශයෙන්, ෆේස්බුක් 'ශ්‍රී ලංකාවේ දේශීය කරුණු පරීක්ෂා කිරීමේ සංවිධාන (AFP සහ Fact Crescendo) සමඟ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීමට' අවධානය යොමු කළේය.[127] අන්තර්ගතය පාලනය කිරීමේ ධාරිතාවයේ වැඩි වීමක් දක්නට ලැබුණද, මෑත කාලීන වාර්තාවකින් හෙළි වූයේ මෙම කරුණු පරීක්ෂා කරන්නන් විසින් අසත්‍ය බව සනාථ කරන ලද ප්‍රවෘත්ති කිසිදු පැහැදිලි කිරීමක් නොමැතිව ෆේස්බුක් හි දිගටම පවතින බවයි.[128] තවද, ආචාරධාර්මික මාධ්‍ය භාවිතයන්ට ආයාචනා කිරීමෙන් පෞද්ගලික ආයතනවලට වෛරී කථනය සහ වැරදි තොරතුරු වලට එරෙහි විය හැකිය. නිදසුනක් ලෙස, වෙරිටේ රිසර්ච් විසින් පවත්වාගෙන යනු ලබන සමාජ මාධ්‍ය වේදිකාවක් වන' එතික්ස් අයි', සදාචාර විරෝධී අන්තර්ගතයන් ප්‍රකාශයට පත් කිරීම සඳහා මාධ්‍ය සංවිධානවල වගකීම ඉස්මතු කරයි.

### 2.3.3. තනි පුද්ගල මට්ටම: පුරවැසියන් විසින් මෙහෙයවනු ලබන මූල පිරීම්

මූලික වශයෙන්, පුරවැසියන්ට වෛරී කථනයේ අංග සහ තහනම් කළ යුතු අන්තර්ගතයන් පිළිබඳව දැනුවත් කළ යුතුය. තොරතුරු සාක්ෂරතාවය වැඩිදියුණු කළ යුතු අතර එමගින් පුද්ගලයන්ට ස්වකීය අභිමතය පරිදි වෛරී කථනයට ප්‍රතිරෝධය දැක්විය හැකිය. ආර්ටිකල් 19 සිය 2018 වාර්තාවේ ප්‍රති-කථනය ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යයන් විසින් ගත හැකි ක්‍රියාමාර්ග සහ මහජනතාවට වෛරී කථනයට ප්‍රතිචාර දැක්විය හැකි ආකාරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කරයි. ඩිජිටල් සාක්ෂරතා කුසලතාවය ඉහළ නැංවීම පිණිස ආයෝජනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙන එම වාර්තාව අන්තර්ජාලය හරහා සම්බන්ධ වීමේ ප්‍රතිලාභ අවබෝධ කර ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දෙයි.[129] ඒ අනුව, පුරවැසියන් අතර දැනුවත්භාවය ඇති කිරීමට සහ සමාජ මාධ්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා සිවිල් සමාජ සංවිධාන සහ අනෙකුත් පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම ගැටලුකාරී අන්තර්ගතයන්ගෙන් වන හානිය අවම කිරීමට මෙන්ම එම අන්තර්ගතය ව්‍යාප්ත වීමේදී සමාජ ප්‍රතිරෝධය ගොඩනැගීමට යහපත් බලපෑමක් ඇති කිරීමට භාවිතා කල හැකි බව පෙනී යන්නකි.[130]

## නිගමනය සහ නිර්දේශ

ශ්‍රී ලංකාවේ විධිමත් නියාමන රාමුව තුළ සමාජ මාධ්‍ය ආවරණය කිරීමට අවශ්‍ය නීතිමය විධිවිධාන පවතී. කෙසේ වෙතත්, එවැනි නීති තෝරාගත් පාර්ශව කෙරෙහි පමණක් ක්‍රියාත්මක කරවීම මෙන් ම සීමාව ඉක්මවා භාවිතා කිරීම හරහා නීතිය අවභාවිතා වීමේ අවධානමක් උද්ගත වී තිබේ. විවේචනාත්මක හා විසංවාදී හඬ නගන්නන් ඉලක්ක කර ගැනීම සඳහා මෙම නීති භාවිතා කිරීමත්, සුළුතර කණ්ඩායම්වලට වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වය ඇති කිරීමට එරෙහිව නීති ක්‍රියාත්මක නොකිරීමත්, වැනි වෛරී කථනය හා වැරදි තොරතුරු සමඟින් බැඳුනු කරුණු, ඒ සම්බන්ධයෙන් ඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා නීතිමය යාන්ත්‍රණයන් මත පමණක් රඳා සිටීමේ සහජ අවදානම පෙන්වා දෙයි.

අනෙක් අතට, විකල්ප නියාමන රාමුව යටතේ හඳුනාගෙන ඇති යාන්ත්‍රණ තුනට(i) සමාජ මාධ්‍ය සමාගම් විසින් ස්වේච්ඡාවෙන් ස්වයං නියාමනය කිරීම; (ii) ස්වාධීන ජාත්‍යන්තර නියාමනය; සහ (iii) සිවිල් සමාජය සහ පෞද්ගලික ආයතන මූලපිරීම් මඟින් ප්‍රති-පණිවිඩ යැවීම උදෙසා පැහැදිලි අභියෝග තිබේ. නිදසුනක් වශයෙන්, සමාජ මාධ්‍ය සමාගම් විසින් ස්වේච්ඡාවෙන් ස්වයං-නියාමනය කිරීමේ ඵලදායීතාවය තවමත් සැක සහිත ය. ෆේස්බුක් වැනි සමාජ මාධ්‍ය සමාගම් ශ්‍රී ලංකා සමාජ මාධ්‍යවල වෛරී කථන ගැටළු වලට ප්‍රතිචාර දක්වා ඇතත්, එහි විනිවිදභාවය සහ අන්තර්ගතය අර්ථවත් ලෙස නියාමනය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු ගැටළු පවතී. අනෙක් අතට පුද්ගල හා

ආයතනික මට්ටමින් ප්‍රති-පණිවිඩ යැවීම වඩාත් ඵලදායී යැයි සැලකෙන්නකි. කෙසේ වෙතත්, මේ සියල්ල සඳහා සමාජ මාධ්‍ය සාක්ෂරතාවය අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය ඵලදායී ලෙස නියාමනය කිරීම සඳහා යාන්ත්‍රණ තුනේම එකතුවක් අවශ්‍ය විය හැකි බව අධ්‍යයනය යෝජනා කරයි. එවැනි විකල්ප නියාමන රාමුවක් විධිමත් නියාමන රාමුව සම්පූර්ණ කරන ආකෘතියක් ලෙස ක්‍රියාත්මක විය යුතුය.

## ප්‍රධාන ක්‍රියාමාර්ග 8 සම්බන්ධ නිරීක්ෂණ

ශ්‍රී ලංකාවේ වෛරී කථනය සහ සාවද්‍ය තොරතුරු නියාමනය කරන විධිමත් හා විකල්ප නියාමන රාමු වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන ක්‍රියාමාර්ග අටක් සම්බන්ධ නිරීක්ෂණ මෙම කොටසින් ඉදිරිපත් කරයි. ඒවා විදිමත් නියාමන යාන්ත්‍රණ හා විකල්ප නියාමන යාන්ත්‍රණ යන එකිනෙකට අනුපූරක වේ. විධිමත් හා විකල්ප නියාමන රාමු හරහා සහයෝගී දියුණුවක් ලබා ගැනීම සඳහා එක් එක් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පෙරමුණ ගත හැකි අදාළ පාර්ශවකරුවන් අනුව නිර්දේශ වර්ගීකරණය කර ඇත.

මැදිහත්වීමේ ප්‍රධාන අංශ තුනක් අනුව නිර්දේශ බෙදා ඇත. ඒවා නම්: (i) ව්‍යවස්ථාදායක නිර්දේශ; (ii) සිවිල් සමාජ සංවිධාන විසින් මෙහෙයවනු ලබන නිර්දේශ සහ (iii) සියලු පාර්ශවයන්ට අදාලවන නිර්දේශයන් වේ. 5 වන වගුව මගින් නිර්දේශයන්ගේ සාරාංශයක් සපයයි.

වගුව 5: ප්‍රධාන ක්‍රියාමාර්ග 8හි සාරාංශයක්

<table>
<tr><th>පාර්ශවකරු</th><th>රාමුව</th><th>අංකය</th><th colspan="2">නිර්දේශය</th></tr>
<tr><td rowspan="6">ව්‍යවස්ථාදායක නිර්දේශ</td><td rowspan="6">විධිමත් නියාමන රාමුව</td><td>1</td><td colspan="2">අයිසීසීපීආර් පනතේ පැහැදිලි බව වැඩි දියුණු කිරීම සඳහා පනත සංශෝධනය කිරීම<br>▪ අයිසීසීපීආර් පනතේ 3 (1) වගන්තිය සංශෝධනය කල යුතුය: එහි පාරිභාෂිත වචන සහ අර්ථනිරූපන රාමුව පැහැදිලි කළ යුතු අතර, එම කොටස යටතේ බන්ධනාගාර ගතකිරීම සම්බන්ධ අපරාධ සම්බාධක ප්‍රචණ්ඩත්වයට පොළඹවන අවස්ථාවන්ට පමණක් සීමා කළ හැකිය.</td></tr>
<tr><td rowspan="4">2</td><td colspan="2">දණ්ඩ නීති සංග්‍රහයේ පැහැදිලි බවක් නොමැති වාක්‍ය ඛණ්ඩ සඳහා පහත වගුව බලන්න.</td></tr>
<tr><td>දණ්ඩ නීති සංග්‍රහයේ අදාළ කොටස</td><td>පැහැදිලි බවක් නොමැති වාක්‍ය ඛණ්ඩය</td></tr>
<tr><td>291(අ) වගන්තිය: ආගමික හැඟීම් රිදවීම සඳහා කැමැත්තෙන්ම වචන භාවිතා කිරීම.</td><td>‘ආගමික හැඟීම් රිදවීම.’</td></tr>
<tr><td>291 (ආ)වගන්තිය: ඕනෑම පංතියක ආගමට හෝ ආගමික විශ්වාසයන්ට අපහාස කිරීමෙන් ආගමික හැඟීම් රිදවීමට අදහස් කරන ඒකාන්ත හා ද්වේෂ සහගත ක්‍රියාවන්.<br>120 වන වගන්තිය: විරුද්ධත්වය ඇවිස්සීම හෝ විරුද්ධත්වය ඇවිස්සීමට තැත් කිරීම.</td><td>‘ආගමික හැඟීම් කෙලෙසීම.’<br>‘විරුද්ධත්වය පිලිබඳ හැඟීම් ඇවිස්සීම.’</td></tr>
<tr><td>3</td><td colspan="2">ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ බලතල පුළුල් කිරීම:</td></tr>
</table>

<table>
<tr><td></td><td></td><td></td><td>▪ වෛරී කථනය සහ සාවද්‍ය තොරතුරු සන්දර්භය තුළ සමාජ මාධ්‍ය නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ බලතල පුළුල් කිරීමට සලකා බැලිය යුතු ය. එවැනි හානිකර අන්තර්ගතයන් ඉවත් කිරීම සහ වැරදිකරුවන් සොයා ගැනීමට එම ආයතනය හැකි කරවිය යුතුය.<br><br>▪ එසේ බලතල පුලුල් කිරීමේ දී, අදාළ කාර්යමණ්ඩලවල කුසලතා සංවර්ධනය කිරීම පූර්ව අවශ්‍යතාවයකි. සමාජ මාධ්‍ය වේදිකාවන් භාවිතා කිරීම සහ ඒ හා බැඳී තිබෙන අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සමග අනුගත වන ඩිජිටල් අයිතීන් වැනි මාතෘකා, එම කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන්වල දී, අවධානයට ගත යුතු ය.</td></tr>
<tr><td></td><td></td><td>4</td><td>රාජ්‍ය විසින් පනවනු ලබන අතරමැදි පාර්ශවකරුවන්ගේ වගකීම:<br><br>▪ සමාජ මාධ්‍ය සමාගම් විසින් සිදු කරන ස්වයං-නියාමනයට අදාළව වැඩි දුර ක්‍රියාමාර්ග ගැනීමට පෙළඹවීම සඳහා ශ්‍රී ලංකාව තුළ අතරමැදි පාර්ශවයන්ගේ වගකීම් හඳුන්වා දීමේ හැකියාව තක්සේරු කල යුතු ය. කෙසේ වෙතත්, එවැනි නීති බලාත්මක කරන්නේ නම්, සංසන්දනාත්මක අත්දැකීම් උපයෝගී කර ගත යුතු අතර භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇහිරෙන ලෙස සහ අනිසි අරමුණු උදෙසා භාවිතා කල හැකි නොවන ලෙස කෙටුම්පත් කළ යුතුය.</td></tr>
<tr><td>සිවිල් සමාජ සංවිධාන විසින් මෙහෙයවනු ලබන නිර්දේශ</td><td>විකල්ප නීතිමය නොවන නියාමන රාමු</td><td>5</td><td>නියාමනය අරමුණු කරගත් අන්තර්ජාතික ස්වාධීන කවුන්සිලයක් පිහිටුවා ගැනීම වෙනුවෙන් මැදිහත් වීම<br><br>▪ සමාජ මාධ්‍ය නියාමනය වෙනුවෙන් ස්වාධීන බාහිර නියාමන යාන්ත්‍රණයන් හඳුන්වාදීම වඩා ප්‍රයෝගික විකල්පයක් යැයි නිර්දේශ ඉදිරිපත්ව ඇත. අන්තර්ජාතික මට්ටමින් කවුන්සිලයක් පිහිටුවීමෙන් එයට,[131]<br>1. ගැලපෙන උපදේශාත්මක ක්‍රියාවලියක් හරහා එක් එක් රටවලින් වාර්තාවන සිදුවීම්වලට මැදිහත්වීමට,<br>2. සමාජ මාධ්‍ය නියාමනය කිරීම වෙනුවෙන් වන නෛතික තත්ත්වන් ස්වාධීනව ගොඩනගා හඳුන්වාදීමට, හැකිය<br><br>ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සිවිල් සමාජ සංවිධානවලට, ආසියා කලාපයේ පවතින අනෙක් සිවිල් සමාජ සංවිධානයන් හා එක්ව, ආසියා කලාපය ආවරණය කැරෙන ඒ ආකාරයේ කවුන්සිලයක් පිහිටුවාගැනීම හරහා එවන් යාන්ත්‍රණයක් ගොඩනැගීම ආරම්භ කළ හැකිය.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| සියලු පාර්ශවයන්ට අදාලවන නිර්දේශ | විධිමත් නියාමන රාමුව | 6 | **අයිසීසීපීආර් පනත පිළිබඳ වැඩි දැනුවත් කිරීමක් ඇති කිරීම**<br><br>▪ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන් අයිසීසීපීආර් පණත නිසි අයුරින් භාවිතා කරන බව තහවුරු කිරීමට සිවිල් සමාජ සංවිධානවලට මැදිහත්විය හැකිය. එය අරමුණු කරගෙන, අදාළ ආයතන සමග අත්වැල් බැදගැනීමටත්, කුසලතා සංවර්ධන සහ පුහුණු වැඩටහන් පැවැත්වීමටත් හැකිය. නීතිය අවභාවිතා කෙරන අවස්ථාවල දී, නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන් ප්‍රසිද්ධියේ වගවීමකට ලක්කිරීමට සිවිල් සමාජ සංවිධානවලට හැකිය.<br><br>▪ මානව හිමිකම් කොමිෂන් සභාව,, ජාතික පොලිස් කොමිසම , අධිකරණ සේවා කොමිෂන් සභාව සහ විනිසුරුවන් පුහුණු කිරීමේ ආයතනය වැනි ආයතනවලට අයිසීසීපීආර් පනතේ පරමාර්ථය හා විෂය පථය පිළිබඳ ධාරිතා වර්ධනය හා පුහුණුව ලබා දිය හැකිය.<br><br>▪ වෛරී කථනය / වැරදි තොරතුරු සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් වාර්තා කිරීමේ දී මාධ්‍ය ආචාර ධර්ම අනුගමනය කෙරෙන බවට මාධ්‍ය විසින් සහතික කල යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ඩිජිටල් ජීවිතය ගොඩනඟන නියාමන රාමුව | 7 | **ජාත්‍යන්තර මානව හිමිකම් සහ සදාචාරාත්මක ප්‍රමිතීන් භාවිතා කරමින් වෛරී කථනය සහ සාවද්‍ය තොරතුරු කෙරෙහි අවධානය යොමු කිරීමට සහ ඒවාට එරෙහි විය හැකි පුරවැසියන් විසින් මෙහෙයවනු ලබන මුලපිරීම් සඳහා ආයෝජනය කිරීම[132]**<br><br>▪ දිවයින පුරා සිටින පුරවැසියන්ගේ ඩිජිටල් සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති අනුගමනය කිරීම සඳහා රජයේ මැදිහත්වීම.<br><br>▪ සාවද්‍ය තොරතුරු හා වෛරී කථනයට එරෙහිව කරුණු පරීක්ෂා කිරීමේ වේදිකා වැනි මුල පිරීම් අත්‍යවශ්‍ය වේ. |
| | | 8 | **ඩිජිටල් සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම වෙනුවෙන් ජාතික මට්ටමේ සිවිල් සමාජ සන්ධානයක් ගොඩනැගීම[133]**<br><br>▪ සම්පත් ඌණතාවය[134], කොළඹ දිස්ත්‍රික්කයෙන් බැහැරව ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධානවලට මුහුණදීමට සිදුවන ගැටලුවකි. ජාතික එකමුතුවක් පිහිටුවාගැනීම හරහා කොළඹ දිස්ත්‍රික්කයෙන් බැහැරව ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධාන මුහුණදෙන සම්පත් ඌණතාවයන්ට විසඳුමක් ලෙස, එම සම්පත්වලට වඩා පුලුල් ප්‍රවේශයන් ඔවුන් වෙනුවෙන් තහවුරු කිරීමට හැකියාව ඇත. |

## පරිච්ඡේදාන්ත සටහන්

[1] දැනුම්වත් කිරීම සඳහා පැවැති සැසිවාරයන්වලට එක්වූ මුලු සංඛ්‍යාව 93ක් විය. ඔවුන්ගෙන් බහුතරයක් වෛරී කථනය නියාමනය කිරීම සහ වැරදි තොරතුරු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින නෛතික නියාමන රාමුව පිළිබඳ නොදන්නා බව එම සැසිවාරයන්වල දී, සිදුකිරීමට හැකිවූ ප්‍රධාන නිරීක්ෂණයක් විය. මෙම අදාළ නෛතික රාමු පිළිබඳව පුද්ගලයින් දැනුම්වත් කිරීම සඳහා පැවැති සැසිවාරයන් 2020 සැප්තැම්බර් මාසයේ දී, ඉංග්‍රීසි සහ සිංහල භාෂා ද්විත්වයෙන්ම, කොළඹ සහ නුවර යන නගරවල දී, පැවැත්විණ. කෙසේවුවත්, කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ 2020 දෙසැම්බර් මාසයට නියමිතව තිබූ සැසිවාරයන් පැවැත්වීමට සිදුවූයේ මාර්ගගතව ය. සිංහල සහ දෙමළ භාෂාවෙන් පැවැති එම සැසිවාරයන්ට, මඩකළපුව, යාපනය, මන්නාරම, ගාල්ල සහ මාතර යන ප්‍රදේශවලින් පුද්ගලයින් සහභාගී විය.
[2] Shilpa Samaratunge & Sanjana Hattotuwa, *Liking Violence: A study of hate speech on Facebook in Sri Lanka* (Centre for Policy Alternatives 2014), p. 3.
[3] Dr. Beata Martin-Rozumiłowicz and Rasťo Kužel, *Social Media, Disinformation and Electoral Integrity: IFES Working Paper* (International Foundation for Electoral Systems 2019), p. 10.
[4]12 වන මූලධර්මය, අදහස් ප්‍රකාශ කිරීමේ හා සමානාත්මතාවයේ නිදහස පිළිබඳ කැම්ඩන් මූලධර්ම (ARTICLE 19, 2009) ('කැම්ඩන් මූලධර්ම').
[5]අයිසීසීපීආර් 19 වන වගන්තිය.
[6] Ministry of Foreign Affaires, *Overview*, at https://mfa.gov.lk/overview/ [last accessed on 19 August 2020].
[7] අයිසීසීපීආර් 19(3) වන වගන්තිය
[8] එක්සත් ජාතීන්ගේ මානවහිමිකම් කවුන්සලය, පොදු නිර්දේශ අංක 34, 43වන පරිච්ඡේදය
[9] Human Rights Council, *Report of the United Nations High Commissioner for Human Rights on the expert workshops on the prohibition of incitement to national, racial or religious hatred* ('Rabat Plan of Action') 11 January 2013, A/HRC/22/17/Add.4, para.29.
[10] Claire Wardle & Hoseein Derakhshan, *Information Disorder: Toward an interdisciplinary framework for research and policy making* (Council of Europe Report 2017), p. 5; Christina Nemr & William Gangware, *Weapons of Mass Distraction: Foreign State-Sponsored Disinformation in the Digital Age* (Park Advisors March 2019), p. 4.
[11] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978), 14(1) (අ) වන ව්‍යවස්ථාව
[12] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978), 15(2) වන ව්‍යවස්ථාව
[13] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978), 15(7) වන ව්‍යවස්ථාව
[14] නිදසුනක් වශයෙන්, 4 වන වගන්තිය සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති අයිතියට පිළිගනු ලබන අතර 5 වන වගන්තිය දරුවෙකුගේ අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රතිපාධන සපයයි.
[15] අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වන වගන්තියට අනුව, 'සඥය' වරදක් වන්නේ සාම නිලධාරියෙකුට වරෙන්තුවක් නොමැතිව පුද්ගලයෙකු අත්අඩංගුවට ගත හැකි වරදකි. 2 වන වගන්තියට අනුව, 'සාම නිලධාරියාට' පොලිස් නිලධාරියෙකු, රජයේ සහකාර ප්‍රාදේශීය නියෝජිතයෙකු සහ ග්‍රාම සේවා නිලධාරියෙකු ඇතුළත් වේ
[16] රබාත් ක්‍රියාකාරී සැලැස්ම, පරිඡේදය. 34.
[17] Human Rights Commission of Sri Lanka, 'Letter to the Acting Inspector General of Police', 23 May 2019, at https://srilankabrief.org/wp-content/uploads/2019/09/HRCSL-letter-to-Acting-Inspector-General-of-Police.pdf [last accessed 30 March 2020].
[18] *Confronting Accountability for Hate Speech in Sri Lanka* (Centre for Policy Alternatives (CPA) 2018) at p. 20 මෙම කොටස යටතේ නඩු තීන්දු ප්‍රකාශයට පත්කිරීමක් හෝ නඩු විභාග පැවැත්වීමක් සිදුව නොමැති බව කතුවරයන් පවසයි.
[19] Fear, shock among Sri Lankan Muslims in aftermath of Buddhist mob violence', *CNN World*, 24 June 2014, at https://edition.cnn.com/2014/06/19/world/asia/sri-lanka-muslim-aluthgama/ [last accessed 11 July 2020].
[20] Ministry of Foreign Affairs, *Right of Reply Sri Lanka 26th Session of the Human Rights Council Agenda Item 4*, at https://www.mfa.gov.lk/images/stories/pdfs/ROR_on_Aluthgama_incident.pdf (last accessed on 19 August 2020).
[21] Farzana Haniffa, Harini Amarasuriya and Vishakha Wijenayake, *Where Have All the Neighbours Gone? Aluthgama Riots and its Aftermath: A Fact-Finding Mission to Aluthgama, Dharga Town, Valipanna and Beruwela* (Law & Society Trust 2014) at https://lstlanka.org/wp-content/uploads/2017/11/aluthgama-report-final-english.pdf [last accessed 10 June 2020], p. 4.

[22] Gehan Gunatilleke, *The Chronic and the Entrenched: Ethno-religious Violence in Sri Lanka* (ICES 2018). For an account of the incident see, *Where have all the neighbours gone?* (Law & Society Trust 2014), *op. cit*, p. 1-6
[23] *The Chronic and the Entrenched: Ethno-religious Violence in Sri Lanka* (ICES 2018), *op cit.*
[24] ‘Gintota unrest: 19 suspects remanded, curfew again today’, *ColomboPage*, 18 November 2017, at http://www.colombopage.com/archive_17B/Nov18_1511026781CH.php [last accessed 26 June 2019].
[25] ඉහත පරිවේඩාන්ත සටහන
[26] ‘Suspects charged under Int’l Covenant on Civil and Political Rights Act’, *The Island*, 3 December 2017, at http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=176019 [last accessed 28 March 2020].
[27] Ampara tense following attack on shop and mosque’, *Sunday Leader*, 28 February 2018, at http://www.thesundayleader.lk/2018/02/27/ampara-tense-following-attack-on-shop-and-mosque/ [last accessed 15 June 2020].
[28] ‘Tension in Ampara after fake ‘sterilization pills’ controversy’, *Sunday Observer*, 4 March 2018, at http://www.sundayobserver.lk/2018/03/04/news/tension-ampara-after-fake-%E2%80%98sterilization-pills%E2%80%99-controversy [last accessed 10 July 2020].
[29] ඉහත පරිචවේඩාන්ත සටහන
[30] Sterilization Pills’ Found To Be Clumps Of Flour: Government Analyst Rules Out Rumours Of Attempted Ethnic Cleansing’, *Asian Mirror*, 8 March 2018, at https://asianmirror.lk/news/item/27037-sterilization-pills-found-to-be-clumps-of-flour-government-analyst-rules-out-rumours-of-attempted-ethnic-cleansing [last accessed 10 July 2020].
[31] ‘Digana turns divisive!’, *Daily FT*, 6 March 2018, at http://www.ft.lk/top-story/Digana-turns-divisive-/26-650661 [last accessed 15 June 2020].
[32] TRC to lift social media ban on Friday’, *Daily FT,* 14 March 2018, at http://www.ft.lk/top-story/TRC-to-lift-social-media-ban-on-Friday/26-651218 [last accessed 6 April 2020].
[33] Emergency Regulations Extraordinary Gazette No 2061/21, issued on 6 March 2018, at http://www.documents.gov.lk/files/egz/2018/3/2061-21_E.pdf [last accessed 17 April 2020].
[34] ‘Digana turns divisive!’, *Daily FT*, 6 March 2018, at http://www.ft.lk/top-story/Digana-turns-divisive-/26-650661 [last accessed 15 June 2020].
[35] The Digana-Kandy Racial Riots: What You Need To Know’, *Roar Media*, 07 March 2018, at https://roar.media/english/life/in-the-know/the-digana-kandy-racial-riots-what-you-need-to-know [last accessed 15 June 2020].
[36] Abuse of ICCPR Act has ‘chilling effect’ on fundamental freedoms’, *Sunday Observer*, 16 June 2019, at http://www.sundayobserver.lk/2019/06/19/news-features/abuse-iccpr-act-has-%E2%80%98chilling-effect%E2%80%99-fundamental-freedoms [last accessed 21 April 2020]; ‘Kandy communal violence: Main suspect arrested’, *Daily News*, 9 March 2018, at http://www.dailynews.lk/2018/03/09/local/145064/kandy-communal-violence-main-suspect-arrested [last accessed 21 April 2020].
[37] Police impose island-side curfew till Tuesday morning amid fears of escalation in violence’, *Sri Lanka Brief*, 13 May 2019, at https://srilankabrief.org/2019/05/mobs-attack-mosques-muslim-owned-shops-and-homes-in-sri-lankas-kurunegala-district/ [last accessed 17 April 2020].
[38] ‘Fear in Sri Lanka as monk calls for stoning of Muslims’ Aljazeera, 22 June 2019, at https://www.aljazeera.com/news/2019/6/22/fear-in-sri-lanka-as-monk-calls-for-stoning-of-muslims [last accessed 15 June 2020].
[39] Extraordinary Gazette No. 2120/5, issued on 22 April 2019, at http://www.documents.gov.lk/files/egz/2019/4/2120-05_E.pdf [last accessed 17 April 2020].
[40] Leader of the Mahason Balakaya Amith Weerasinghe further remanded’, *News 1st*, 28 May 2019, at https://www.newsfirst.lk/2019/05/28/leader-of-the-mahason-balakaya-amith-weerasinghe-further-remanded/ [last accessed 26 June 2020].
[41] Police remand 78 involved in violence’, *op. cit*.
[42] 13 arrested for riots in Minuwangoda to be produced in court today’, *ColomboPage*, 14 May 2019, at http://www.colombopage.com/archive_19A/May14_1557817003CH.php [last accessed 17 April 2020].
[43] මෙම සිදුවීම සම්බන්ධයෙන් වන විස්තරයක් සඳහා බලන්න,, ‘Abuse of ICCPR Act has ‘chilling effect’ on fundamental freedoms’*, op. cit*.
[44] Arrest of writer Sathkumara sparks debate on freedom of expression’, *Daily Mirror,* 12 April 2019, at http://www.dailymirror.lk/news-features/Arrest-of-writer-Sathkumara-sparks-debate-on--freedom-of-expression/131-165392 [last accessed 17 April 2020].

[45] Sri Lankan authorities delay on whether to prosecute award-winning writer Shakthika Sathkumara' *World Socialist Web Site*, 16 December 2019, at https://www.wsws.org/en/articles/2019/12/16/sath-d16.html [last accessed 17 April 2020].

[46] මෙම සිදුවීම සම්බන්ධයෙන් වන විස්තරයක් සඳහා බලන්න,, 'Abuse of ICCPR Act has 'chilling effect' on fundamental freedoms', *op. cit.*

[47] Damith Chandimal and Ruki Fernando, 'Sri Lanka: The Truth About the Arrest and Detention of Ramzy Razeek', *Sri Lanka Brief*, 14 April 2020, at https://srilankabrief.org/2020/04/sri-lanka-the-truth-about-the-arrest-and-detention-of-ramzy-razeek/ [last accessed 17 July 2020].

[48] *See original Facebook post by Ramzy Razeek,* 2 April 2020, at https://www.facebook.com/ramzy.razeek.5/posts/3367204646642916 [last accessed 17 July 2020].

[49] Damith Chandimal and Ruki Fernando, 'Sri Lanka: The Truth About the Arrest and Detention of Ramzy Razeek', *Sri Lanka Brief*, 14 April 2020, at https://srilankabrief.org/2020/04/sri-lanka-the-truth-about-the-arrest-and-detention-of-ramzy-razeek/ [last accessed 17 July 2020].

[50] 291(අ) වගන්ති දක්වන්නේ 'යම් තැනැත්තෙකුගේ ආගමික හැඟීම්වලට රිදවීමේ ඒකාන්ත අදහසින් හෝ එකී තැනැත්තාට ඇසෙන ලෙස යමකු යම් වචනයක් කියතොත් හෝ ශබ්දයක් කළහොත් හෝ එකී තැනැත්තාට පෙනෙන පරිදි යම් සංඥාවක් කරතොත් හෝ එකී තැනැත්තා අභිමුඛයෙහි යම් ද්‍රව්‍යයක් තබතොත් ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයට බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය'

[51] 291(ආ) වගන්තිය දක්වන අන්දමට ' මහ රජතුමාණන් යටත් වැසියන් පංතියක ආගමික හැඟීම් කෙලෙසීම සඳහා ඒකාන්ත හා ද්වේෂ සහගත අදහසින් භාෂිත හෝ ලිඛිත වචනයෙන් හෝ දැකිය හැකි නිරූපණවලින් එකී පංතියේ ආගමට හෝ ආගමික විශ්වාසවලට නින්දා කරන හෝ නින්දා කිරීමට තැත් කරන තැනැත්තෙකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය'

[52] 'BASL issues severe indictment on IGP, AG, govt over attacks on minorities', *The Island*, 1 June 2017, at http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=166041 [last accessed 17 April 2020].

[53] *Confronting Accountability for Hate Speech in Sri Lanka* (CPA 2018), *op. cit.*, p. 30-35.

[54] Human Rights Watch, 'Sri Lanka: Halt Harassment of Media: Websites Blocked, Journalists Face Charges', 3 July 2017, at https://www.hrw.org/news/2012/07/03/sri-lanka-halt-harassment-media [last accessed 6 April 2020] ජනපතිවරයා හෝ රජය කෙරේ අපුල හැඟීමක් ඇති කෙරෙන පරිදි කටයුතු කිරීමට හෝ ඇති කිරීමට උත්සාහ කළේ යැයි ශ්‍රී ලංකා මිරර්ට එරෙහිව චෝදනා ගොනු කිරීම මෙයට උදාහරණයකි.. See also, 'Four arrested for circulating harmful SMSs', *Daily Mirror*, 6 August 2014, at http://www.dailymirror.lk/50702/tech [last accessed 17 April 2020] ජන කොට්ඨාසයන් අතර අසමගිය ඇතිවන ආකාරයේ කෙටි පණිවිඩයක් බෙදා හැරියේ යැයි පුද්ගලයින් සිව් දෙනෙක් අත්අඩංගුවට ගැනීම මෙයට උදාහරණයකි.

[55] *Sisira Kumara Wahalathanthri and Another v. Jayantha Wickramaratne and Others*, SC(FR) Application 768/2009 (Supreme Court of Sri Lanka) judgment delivered on 5 November 2015, at www.supremecourt.lk/images/documents/sc_fr_768_2009.pdf [last accessed 17 April 2020], p. 19.

[56] 'Penal Code is being used fraudulently: JVP', *Daily Mirror*, 22 February 2012, at http://www.dailymirror.lk/breaking_news/penal-code-is-being-used-fraudulently-jvp/108-17020 [last accessed 29 April 2020]. See also ARTICLE 19, *An Agenda for Change: the right to freedom of expression in Sri Lanka, 2*7 October 1994, at https://www.refworld.org/publisher,ART19,,LKA,475418a40,0.html [last accessed 29 April 2020], at p. 26 සාමකාමී විවේචනයන් නිහඩ කරවීම සඳහා වගන්ති අංක 120 යෙදා ගත් අවස්ථාවක් පිළිබඳව, 1992 වසරේ පැවැති නඩු විභාගයක් ඇසුරින් සඳහන් කර ඇත.

[57] *Naomi Michelle Cokeman v. The Attorney General and Others,* SC (FR) Application 136/2014 (Supreme Court of Sri Lanka) judgment delivered on 15 November 2017, at http://www.supremecourt.lk/images/documents/sc_fr_136_2014.pdf [last accessed 18 April 2020].

[58] ඉහත පරිච්ඡේදාන්ත සටහන සටහන, පිටුව 3

[59] 'Sri Lanka government intensifies crackdown on social media', *World Socialist Web Site*, 9 April 2020, at https://www.wsws.org/en/articles/2020/04/09/medi-a09.html [last accessed 21 April 2020].

[60] ඉහත පරිච්ඡේදාන්ත සටහන

[61] ඉහත පරිච්ඡේදාන්ත සටහන

[62] 'රුපියල් දෙසියයකට නොඉක්මවන දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නොමැතිව මාස 12 ක් නොඉක්මවන සිර දඬුවමකින් දඬුවම් කල හැකි ය. ඔහු දෙවන වරටත් වැරදිකරුවකු වුවහොත් හෝ වරදින් ඉවත්වන ලෙසට කෙරෙන අවවාද නොසලකා වරදෙහි දිගටම නියැලී සිටියහොත්, ඔහුට කස පහර විස්සකට නොඅඩු ප්‍රමාණයකින් දඬුවම් කල යුතුය. සටහන: 2005 අංක 23 දරණ ශාරීරික දඬුවම් (ඉවත් කිරීමේ) පනත මඟින් කස පහර දීමේ දඬුවම ඉවත් කර තිබේ.

[63] HRCSL Letter April 2020, *op. cit.*

[64]1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥා පනත, පූර්විකාව

[65] මහජන ආරක්ෂක ආඥා පනත, 5 වගන්තිය

[66] මහජන ආරක්ෂක ආඥා පනත, 5 වගන්තිය
[67] මහජන ආරක්ෂක ආඥා පනත, 7 සහ 8 වගන්ති
[68] නිදසුනක් ලෙස: 1998 ජුනි 5 දිනැති (1999 ජුනි 6 වන දින සංශෝධිත) 1030/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1998 අංක 1 දරණ (සංවේදී මිලිටරි තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සහ සම්ප්‍රේෂණය කිරීම තහනම් කෙරෙන හදිසි නීති රෙගුලාසියට අනුව " ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමට සහය දීම පිණිස, ත්‍රිවිධ හමුදාවේ හෝ පොලීසියේ ප්‍රධානියෙකුගේ, හෝ ඕනෑම සාමාජිකයෙකුගේ හෝ හමුදාපතිවරයා විසින් බලය පවරන ලද ඕනෑම පුද්ගලයෙකුගේ නිල හැසිරීම්, චිත්ත ධෛර්යය හා සම්බන්ධ කිසිදු ප්‍රකාශයක් ප්‍රකාශයට පත් කිරීම තහනම්" වේ. සුනිලා අබේසේකර එදිරිව ආරිය රුබසිංහ සහ තවත් අය [2000] 1 ශ්‍රීල නී වා 314 හිදී, අදිකරණය කියා සිටියේ හදිසි නීති රෙගුලාසි මඟින් පනවා ඇති සීමාවන් එම රෙගුලාසි වල නීත්‍යානුකූල අරමුණට (එනම් ජාතික ආරක්ෂාවතහවුරු කිරීමේ අවශ්‍යතාවයට) අසමානුපාතික නොවන බවයි.
[69] හදිසි අවස්ථා රෙගුලාසි 2018 රෙගුලාසි අංක 15: කට වචනයෙන් හෝ 'ඩිජිටල් සහ සමාජ මාධ්‍ය ඇතුළු වෙනත් ආකාරයකින් ජනතාව බිය වැද්දීම , පොදු අසහනය, වාර්ගික හිංසනය හෝ වරදක් කිරීමට පෙළඹවීම යන කිසිවක් සිදු විය හැකි ආකාරයේ කටකතාවක් හෝ අසත්‍ය ප්‍රකාශයක් හෝ ප්‍රසිද්ධියක් ඇති කිරීමට ඉඩ ඇති තොරතුරු හෝ ඡායාරූපයක් හෝ පණිවුඩයක් කිසිදු පුද්ගලයෙකුවිසින් ප්‍රකාශයට පත් නොකළ යුතුය.
[70] Extraordinary Gazette No. 2120/5, issued on 22 April 2019, at http://www.documents.gov.lk/files/egz/2019/4/2120-05_E.pdf [last accessed 17 April 2020].
[71] ශ්‍රී ලංකාවේ හදිසි නීතිය සම්බන්ධයෙන් වන දළ විශ්ලේෂණයක් සඳහා, දීපිකා උඩුගමගේ මෙම ප්‍රකාශනය බලන්න,, 'An Eager Embrace: Emergency Rule and Authoritarianism in Republican Sri Lanka' in Asanga Welikala (ed), *Reforming Sri Lankan Presidentialism: Provenance, Problems and Prospects* (CPA 2015), at http://www.mediareform.lk/wp-content/uploads/2020/01/Deepika-Udagama-2015-An-Eager-Embrace-Emergancy-Rule-and-Authoritarianism-in-Republic-Sri-Lanka.pdf [last accessed 29 April 2020], p. 286- 332. See also International Commission of Jurists, *Sri Lanka: Briefing Paper: Emergency Laws and International Standards* (March 2009), at https://www.icj.org/wp-content/uploads/2012/05/SriLanka-emergencylaws-advocacy-2009.pdf [last accessed 21 April 2020].
[72] වරදට දඬුවම රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයක් හෝ මාස හයක් දක්වා සිර දඬුවමක් හෝ ඒ දෙකෙන් ම දඬුවම් කිරීමක් විය හැක.
[73] ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත 69 වන වගන්තිය. සටහන: ඇමතිවරයා මෙය කළ යුත්තේ ගැසට් පත්‍රයේ නියෝගයක් එල කිරීම මගිනි. අමාත්‍යවරයාට විදුලි සංදේශනය තහනම් කිරීමට, අධීක්ෂණය කිරීමට හෝ පාලනය කිරීමට හැකියාව පවතී. අවසාන වශයෙන්, ඇමතිවරයාට අවශ්‍ය අවස්තාවක විදුලි සංදේශ අධීක්ෂණය හෝ පාලනය හරහා සියලුම හෝ නිශ්චිත පණිවිඩ පාලනය කිරීමට හෝ වාරණය කිරීම සඳහා ප්‍රතිපාදන සැපයිය හැකිය.
[74]ඉහත පරිච්ඡේධාන්ත සටහන: සටහන: පසුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2017 දී ලංකා ඊ නිව්ස් අවහිර කිරීම පිළිබඳ තොරතුරු අනාවරණය කරන ලදී. See 'RTI Reveals Lanka E News Blocked On Order from President's Office', *Groundviews,* 11 April 2018, at https://groundviews.org/2018/04/11/lanka-e-news-blocked-on-order-from-presidents-office-rti-reveals/ [last accessed 6 April 2020].
[75] Facebook and other Social Media Networks are temporarily blocked', *News 1st*, 7 March 2018, at https://www.newsfirst.lk/2018/03/07/measures-taken-monitor-social-media-websites-trc/ [last accessed 6 April 2020]; 'Sri Lanka blocks social media networks to stop sectarian violence', *Reuters* , 7 March 2018, at https://www.reuters.com/article/sri-lanka-clashes-internet/sri-lanka-blocks-social-media-networks-to-stop-sectarian-violence-idUSL4N1QP39X [last accessed 6 April 2020].
[76] Sri Lanka blocks social media after deadly Easter explosions', *CCNET*, 21 April 2019, at https://www.cnet.com/news/sri-lanka-shuts-down-social-media-following-deadly-easter-explosions/ [last accessed 6 April 2020]; 'Sri Lanka attacks: The ban on social media', *BBC News*, 23 April 2019, at https://www.bbc.com/news/technology-48022530 [last accessed 17 April 2020].
[77] RTI Reveals Lanka E News Blocked On Order from President's Office', *Groundviews,* 11 April 2018, at https://groundviews.org/2018/04/11/lanka-e-news-blocked-on-order-from-presidents-office-rti-reveals/ [last accessed 6 April 2020].
[78] Sri Lanka President takes control of telecommunication authority', *ColomboPage*, 8 March 2019 , at http://www.colombopage.com/archive_19A/Mar09_1552151677CH.php [last accessed 6 April 2020].
[79] Defence Secretary takes office as TRC Chairman', *Daily FT*, 7 December 2019, at http://www.ft.lk/front-page/Defence-Secretary-takes-office-as-TRC-Chairman/44-691169 [last accessed 6 April 2020].
[80] [80] *Reforming Sri Lankan Presidentialism: Provenance, Problems and Prospects* (CPA 2015), *op. cit.* p. 296-297.
[81] මුල් පනතේ 29 වන වගන්තිය ('පනතේ කාලසීමාව') පනත වසර 3 ක් සඳහා ක්‍රියාත්මක වන බවට ප්‍රතිපාධන සපයා ඇත. 1982 අංක 10 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) සංශෝධන පනත මගින් මෙම කොටස අවලංගු කරන ලදී.
[82] ත්‍රස්තවාධය වැළක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත, 1979 අංක 48, 3වන වගන්තිය

[83] අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ එල කරනු ලබන  නියෝගයක් මත.

[84]ත්‍රස්තවාධය වැළක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත 14 (2) (ii) සහ 14 (3) වගන්ති, වසර 5 ක් දක්වා සිර දඬුවමකින් දඬුවම් කල හැකි අතර  අධිකරණය විසින් වෙනත් දඬුවම් ද නියම කළ හැකිය.

[85] Sri Lanka's draft Counter Terrorism Act: a license for continued state oppression, intimidation and torture', *Sri Lanka Campaign for Peace & Justice*, 4 May 2017, at https://www.srilankacampaign.org/sri-lankas-draft-counter-terrorism-act-license-continued-state-oppression-intimidation-torture/ [last accessed 18 April 2020]. See also Human Rights Watch, 'Locked Up Without Evidence: Abuses under Sri Lanka's Prevention of Terrorism Act', 29 January 2018, at https://www.hrw.org/report/2018/01/29/locked-without-evidence/abuses-under-sri-lankas-prevention-terrorism-act [last accessed 18 April 2020] which refers to several instances when the provisions of the PTA were misapplied.

[86] *The Judicial Mind in Sri Lanka; Responding to the Protection of Minority Rights*, (Law & Society Trust 2014) *op. cit.*, p. 243-244; Niran Anketell & Gehan Gunatilleke, 'Emergency Law in the Context of Terrorism – Sri Lanka', at http://www.southasianrights.org/wp-content/uploads/2009/10/SL-Terrorism-and-Emergency-Laws_Draft1.pdf [last accessed 18 April 2020] p. 23-24.

[87] Sri Lanka government decides to withdraw Counter Terrorism Bill', *ColomboPage*, 03 January 2020, at http://www.colombopage.com/archive_20A/Jan03_1578067614CH.php [last accessed 26 January 2020].

[88] වසර 5ක් දක්වා වන සිර දඬුවමකින් දඬුවම් කල හැක.

[89] 'Man suspected of spreading false information on coronavirus granted bail', *ColomboPage*, 16 March 2020, at http://www.colombopage.com/archive_20A/Mar16_1584376889CH.php [last accessed 18 April 2020].  සටහන- කොරෝනා වෛරසය පිළිබඳ අසත්‍ය තොරතුරු බෙදා හැරියේ යැයි, පරිගණක අපරාධ පණත යටතේ තවදුරටත් අත්අඩංගුවට ගැනීම් සිදුවනු ඇතැයි මෙසමයෙහි පළවූ මාධ්‍ය වාර්තාවල වැඩිදුරටත් සඳහන් විය. බලන්න- 'Investigations underway to arrest 40 suspects for spreading fake news on social media', *News 1st*, 17 March 2020, at https://www.newsfirst.lk/2020/03/17/investigations-underway-to-arrest-40-suspects-for-spreading-fake-news-on-social-media/ [last accessed 18 April 2020].

[90] සටහන: මෙම තොරතුරු ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සන්සධයේ වෙබ් අඩවියෙන් උපුටා ගන්නා ලද්දකි. at https://www.cert.gov.lk/aboutUs.php [last accessed 18 April 2020].

[91] Note: The following information is taken from the SLCERT website, at https://www.cert.gov.lk/aboutUs.php [last accessed 18 April 2020].

[92] CID to fight cyber-crime with Hi-Tech Crime Investigation Units', *Sunday Observer*, 1 November 2015, at http://www.sundaytimes.lk/151101/news/cid-to-fight-cyber-crime-with-hi-tech-crime-investigation-units-169982.html [last accessed 21 April 2020].

[93] ඉහත පරිච්ඡේධාන්ත සටහන

[94] 94 UN Human Rights Council Special Rapporteur on Minority Issues (HRC 2015), cited in *Countering Online Hate Speech,* UNESCO Series on Internet Freedom (United Nations Educational, Scientific, and Cultural Organisation 'UNESCO' 2015), at https://unesdoc.unesco.org/ark:/48223/pf0000233231 [last accessed 27 March 2020].

[95] Article 19, *Self-regulation and 'hate speech' on social media platforms* (2018), at https://www.article19.org/wp-content/uploads/2018/03/Self-regulation-and-%E2%80%98hate-speech%E2%80%99-on-social-media-platforms_March2018.pdf [last accessed 27 March 2020] p.9. The report briefly discussed the three types of media regulatory mechanisms - statutory regulation, co-regulation and self-regulation.

[96] ඉහත පරිච්ඡේධාන්ත සටහන

[97] ඉහත පරිච්ඡේධාන්ත සටහන, පිටුව 15

[98] Website of Facebook, Community Standards, at https://www.facebook.com/communitystandards/hate_speech [last accessed 28 March 2020].

[99]සටහන: මාර්ගෝපදේශ මඟින් ප්‍රමිතීන් උල්ලං that නය වන අන්තර්ගතයේ පරිපූර්ණ නොවන ලැයිස්තුවක් ඉදිරිපත් කරයි

[100] ඉහත පරිච්ඡේධාන්ත සටහන

[101] Facebook Transparency, *Community Standards Enforcement Report* (November 2019), at https://transparency.facebook.com/community-standards-enforcement#hate-speech [last accessed 28 March 2020].

[102] ඉහත පරිච්ඡේධාන්ත සටහන

[103] ඉහත පරිච්ඡේධාන්ත සටහන

[104] Website of YouTube, Hate Speech Policy, at https://support.google.com/youtube/answer/2801939?hl=en  [last accessed 28 March 2020]. The site offers examples of what would amount to 'hate speech'.

[105] Website of YouTube, Community Guidelines strike basics, at https://support.google.com/youtube/answer/2802032?hl=en [last accessed 28 March 2020].
[106] Website of Twitter, Rules and Policies, at https://help.twitter.com/en/rules-and-policies/hateful-conduct-policy [last accessed 28 March 2020].
[107] උදාහරණයක් ලෙස: ආරක්ෂිත කාණ්ඩයක් ගැන බිය ඇති කිරීම.
[108] For details on the different types of action, see Website of Twitter, Enforcement options, at https://help.twitter.com/en/rules-and-policies/enforcement-options [last accessed 28 March 2020].
[109] Website of Instagram, Community Guidelines, at https://help.instagram.com/477434105621119/?helpref=hc_fnav&bc[0]=Instagram%20Help&bc[1]=Privacy%20and%20Safety%20Center [last accessed 28 March 2020].
[110] ඉහත පරිච්ඡේධාන්ත සටහන
[111] *Self-regulation and 'hate speech' on social media platforms*, (2018), *op. cit.*, p. 16.
[112] Mazin Hussain, 'The deadly Facebook cocktail: Hate Speech and Misinformation in Sri Lanka', *ReadME*, 14 May 2019, at https://www.readme.lk/facebook-hate-speech-misinformation-sri-lanka/ [last accessed 22 April 2020].
[113] Twitter Account of Yudhanjaya Wijeratne, Tweet dated 24 April 2019, at https://twitter.com/yudhanjaya/status/1121054915692908545?s=20 [last accessed 15 June 2020].
[114] Meera Srinivasan, 'Online hate and its offline costs', *The Hindu,* 16 May 2020, at https://www.thehindu.com/news/international/online-hate-and-its-offline-costs/article31603139.ece [last accessed 30 June 2020].
[115] *Self-regulation and 'hate speech' on social media* platforms, (2018), *op. cit.* p. 20.
[116] ඉහත පරිච්ඡේධාන්ත සටහන
[117] ඉහත පරිච්ඡේධාන්ත සටහන
[118] p. ඉහත පරිච්ඡේධාන්ත සටහන, කවුන්සලය පිහිටුවීමේදී සලකා බැලිය යුතු සාධක සඳහා 21-22 පිටු බලන්න.
[119] Website of Sri Lanka Press Institute, at https://www.slpi.lk/ [last accessed April 2020].
[120] *Countering Online Hate Speech*, (UNESCO 2015), *op. cit.*
[121] ඉහත පරිච්ඡේධාන්ත සටහන, 5වන පිටුව
[122] Article 19, *Responding to 'hate speech' with positive measures: A case study from six EU countries* (2018), p. 28.
[123] ඉහත පරිච්ඡේධාන්ත සටහන
[124] හැෂ් ටැග් ජෙනරේෂන් යනු දේශීය, ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමින් ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා තරුණ තරුණියන්ගේ පූර්ණ හා ඵලධායී සහභාගීත්වය වෙනුවෙන් පෙනී සිටින තරුණ නායකත්වයෙන් යුත් ව්‍යාපාරයකි. See https://www.facebook.com/pg/hashtaggenerationsl/about/?ref=page_internal [last accessed 11 June 2020].
[125] යුරෝපීය සංගම් මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුම් අවසන් වාර්තාවේ හැෂ් ටැග් ජෙනරේෂන් විසින් ලබා දුන් සහාය ගැන සඳහන්වේ: *Sri Lanka Presidential election, 16 November 2019* (2020), at http://www.epgencms.europarl.europa.eu/cmsdata/upload/570dea26-4277-40e6-abb8-f50c59c8d403/Sri-Lanka_presidential_election_16_November_2019_EU_EOM_report.pdf [last accessed 11 June 2020] p.43.
[126]ඩිමොක්‍රසි රිපෝර්ටින් ඉන්ටනැෂනල් හී වෙබ් අඩවිය 'සමාජ මාධ්‍ය අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ඩීආර්අයි දේශීය හවුල්කරුවන් සමඟ කටයුතු කරයි', 2019 දෙසැම්බර් 16, at https://democracy-reporting.org/sri-lanka-dri-works-with-local-partners-to-strengthen-social-media-monitoring/ [last accessed 11 June 2020].
[127] Website of Facebook, Newsroom, Miranda Sissons, 'An update on Facebook's Human Rights work in Asia and around the world', 12 May 2020, at https://about.fb.com/news/2020/05/human-rights-work-in-asia/ [last accessed 30 June 2020].
[128] Hashtag Generation, *Findings from the social media monitoring exercise during the 2019 Sri Lankan Presidential Election* (2019), at https://hashtaggeneration.org/wp-content/uploads/2020/01/social-media-monitoring-report.pdf [last accessed 30 June 2020] p. 19; See Twitter account of Sanjana Hattotuwa, Tweet dated 06 March 2020, at https://twitter.com/sanjanah/status/1235656870724915200?ref_src=twsrc%5Etfw%7Ctwcamp%5Etweetembed%7Ctwterm%5E1235656870724915200%7Ctwgr%5E&ref_url=https%3A%2F%2Fict4peace.wordpress.com%2F2020%2F05%2F13%2Ffacebooks-human-rights-impact-assessment-hria-of-sri-lanka-some-brief-thoughts%2F [last accessed 30 June 2020].
[129]*Responding to 'hate speech' with positive measures: A case study from six EU countries* (2018), *op. cit.*,p. 23; See also *Countering Online Hate Speech* (UNESCO 2015), *op. cit.*, at p. 45-52 which refers to examples of initiatives that seek to improve digital literacy.

[130] European Union Election Observation Mission, *Final Report: Sri Lanka Presidential election (16 November 2019), January* 2020, *op. cit.*, p. 35. at https://eeas.europa.eu/sites/default/files/sl2019_final_report_24_january_2020.pdf [last accessed 25 March 2021].

[131] *Self-regulation and 'hate speech' on social media* platforms, (2018), *op. cit.*, p. 20.

[132] විවිධ පුරවැසියන් විසින් මෙහෙයවනු ලබන මුල පිරීම් වැඩි කිරීමේ හා ඉදිරියට ගෙන යාමේ මෙම අවශ්‍යතාවය, විශේෂයෙන් මහනුවර පැවති රැස්වීම් සැසි වලදී ප්‍රකාශ වූ අදහසක් විය.

[133] සිවිල් සමාජ සංවිධානවල ජාතික එකමුතුවක් පිහිටුවීමේ අවශ්‍යතාවය 2020 සැප්තැම්බර් සිට 2020 දෙසැම්බර් දක්වා කාලසීමාව තුළදී ලැබුණු අදහස් හා යෝජනාවන් හී අන්තර්ගත විය.එවන් ජාතික එකමුතුවක් පිහිටුවීම තුළින් වෛරී කතණය සහ දුශ් තොරතුරුවලට එරෙහිව පෙනී සිටින කණ්ඩායම් (විශේෂයෙන් බිම් මට්ටමේ සංවිධානවලට)සිය වැඩ කටයුතු ඉදිරියට ගෙන යාමට පහසුවන අතර ම ඔවුන්ගේ ගැටලු ප්‍රකාශ කිරීමට ආරක්ෂිත ඉඩකඩක් සලසාගත හැකි ය.

[134] Sierra Amarasiri and Shamana Amjah (Verité Research), *2019 Civil society Organisation Sustainability Index: Asia Region: Sri Lanka Country Report* (August 2020), at https://www.veriteresearch.org/publication/cso-sustainability-index-2019-sri-lanka-country-report/ [last accessed 15 October 2020].